සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 13 ශ්‍රේණිය, දෙවන වාර පරීක්ෂණය, 2020 මාර්තු

**General Certificate of Education (Adv. Level), Grade 13, Second Term Test, March 2020**

**ව්‍යාපාර අධ්‍යයනය - I**

**Business Studies - I**

32 S I

පැය 02 යි

**Time: 02 hours**

විභාග අංකය : ...................................................................

**උපදෙස් :**

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.**
- **ප්‍රශ්න අංක 01 සිට 30 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, එහි අංකය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.**

01. පහත සඳහන් ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශ පමණක් ඇති පිළිතුර තෝරන්න.

A - ඕනෑම ව්‍යාපාරයකට පදනම අවශ්‍යතා හා වුවමනාය.
B - ක්‍රයශක්තිය තුළින් ඉල්ලුම හටගනී.
C - ප්‍රාථමික, ද්විතීයික, තෘතියික වශයෙන් වක්‍ර නිෂ්පාදනය මූලික කාණ්ඩ තුනකි.
D - හුවමාරුව සඳහා මූලික කරුණු කිහිපයක් සම්පූර්ණ විය යුතුය.
E - ව්‍යාපාර ආයතනයක කටයුතු කොටස්වලට බෙදා එක් එක් කොටස් සඳහා සේවකයන් යොදාගැනීම ආයතනික විශේෂීකරණයයි.

1. A, B හා C
2. A, C හා D
3. B, C හා D
4. B, D හා E
5. A, D හා E

(.............)

02. දිගින් දිගටම අලාභ ලබමින් වුවද කුමාර තම ව්‍යාපාරයට නොකඩවා මිල දී ගැනීමත් විකිණීමත් සිදු කරනු ලබන්නේ අනාගතයේ තම ව්‍යාපාරය වර්ධනය කර ලාභ ලැබීමට හා තම ධනය වැඩි කර ගැනීමටත් අපේක්ෂාවෙනි. ව්‍යාපාර ගති ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ. ඒ අතුරින් කුමාරගේ ව්‍යාපාරයේ දැකිය හැකි ගති ලක්ෂණ 04 පිළිවෙලින් දැක්වූ විට නිවැරදි පිළිතුර තෝරන්න.

A - විකුණුම් හෝ හුවමාරු සිදුවීම
B - භාණ්ඩ හා සේවා ගනුදෙනු වීම
C - ගනුදෙනු අඛණ්ඩව සිදුවීම
D - ලාභයෙන් අභිප්‍රේරණය වීම
E - අවධානමක් තිබීම
F - වුවමනා නිර්මාණය කිරීම
G - ආර්ථික කටයුත්තක් වීම

1. C, D, G, B
2. G, F, E, B
3. E, A, C, D
4. A, B, E, G
5. A, E, C, G

(.............)

03. පහත දැක්වෙන්නේ තිරසර සංවර්ධනය තහවුරු කිරීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග කිහිපයකි.

A - නවෝත්පාදන හඳුන්වාදීම
B - පරිසර හිතකාමී දේ මිලට ගැනීම
C - මානව අයිතීන් සුරැකීමට දායකවීම
D - සේවක සුභසාධනය
E - නීතිය හා සාමය සුරැකීම
F - ජෛව විවිධත්වය රැකීමට කටයුතු කිරීම

මේ අතුරින් සමාජ හා සංස්කෘතික තිරසර බව තහවුරු කිරීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග පමණක් ඇතුළත් වරණය තෝරන්න.

1. A හා E 2. C හා D 3. D හා F
4. C හා E 5. A හා B

(.............)

04. පහත දැක්වෙන්නේ ශිෂ්‍යයකු විසින් ඉදිරිපත් කරන ලද ප්‍රකාශ පහකි. ඉන් නිවැරදියයි පිළිගතහැකි ප්‍රකාශය වන්නේ,

1. වාණිජ බැංකුවල ප්‍රාග්ධනය හා වත්කම් අතර අවම අනුපාත නියම කිරීම ගුණාත්මක ණය සීමා පැනවීමකි.
2. ආනයනික භාණ්ඩ සඳහා රේගුබදු අයකිරීමෙන් ආනයන සීමා වුව ද ඉන් දේශීය කර්මාන්ත ආරක්ෂා කර ගැනීම සඳහා කිසිදු බලපෑමක් එල්ල නොවේ.
3. රජයේ ආදායම් හා වියදම් වල වෙනස්වීම හා සෘජුව සම්බන්ධ වන්නේ පිස්කල් ප්‍රතිපත්තියයි.
4. උද්ධමනකාරී අවස්ථාවක උද්ධමනය පාලනය සඳහා පරිභෝජන ණය ධෛර්යමත් කළ යුතුය.
5. මහ බැංකු පොළී අනුපාතිකය වැඩි කිරීමත් සමඟ ආයෝජකයන්ගේ ආයෝජන ප්‍රමාණය වැඩි කරනු ලැබේ.

(.............)

05. පහත දක්වෙන්නේ රජයේ ආර්ථික අරමුණු සහ ඒවා ඉටුකර ගැනීමට ව්‍යාපාර දායක විය හැකි ආකාරයන්ය.

A - පූර්ණ සේවා නියුක්තිය
B - නීතිරීති පිළිපැදීම
C - බදු ගෙවීම
D - අභ්‍යන්තර හා බාහිර මිල ස්ථායීතාව
E - දේශීය සම්පත් භාවිතය
F - සාධාරණ ආදායම් ව්‍යාප්තිය

මේවා අතුරින් රජයේ ආර්ථික අරමුණු වන්නේ,

1. A D F 2. B C D 3. D E F
4. A B C 5. C D E

(.............)

06. විධිමත් ව්‍යාපාර සංවිධානයක පැවතිය යුතු අවශ්‍යතා වන්නේ,

A - පෞද්ගලික අංශය සතුවීම
B - වගකීම් හා බලතල බෙදීයන සංවිධාන ව්‍යුහයක් පැවතීම
C - ප්‍රමාණවත් වෙළෙඳපොළක් පැවතීම
D - මුදුන් පමුණුවා ගැනීමට උත්සාහ දරන අරමුණක් පැවතීම
E - සන්නිවේදනය හා තොරතුරු ගලායන ක්‍රියාවලියක් පැවතීම

1. A, B, C 2. B , C, D 3. C, D, E
4. B, D, E 5. A, C, E

(.............)

07. රාජ්‍ය සංස්ථා හා රාජ්‍ය දෙපාර්තමේන්තුවලට අයත් ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

A - රජයේ වාර්ෂික අයවැය ලේඛනය මගින් අවශ්‍ය අරමුදල් ප්‍රතිපාදනය කිරීම
B - නෛතික පුද්ගලභාවයක් නොමැති වීම
C - විශේෂ හෝ පොදු පනතක් යටතේ සංස්ථාපනය කිරීම
D - පූර්ණ අයිතිය හෝ වැඩි අයිතිය රජය සතුවීම
E - අමාත්‍යාංශයක් යටතේ ඍජු පාලනයට යටත්වීම

ඉහත ලක්ෂණ අතුරින් රාජ්‍ය සංස්ථාවලට අදාල ඒවා පමණක් ඇතුළත් වරණය වන්නේ,

1. A හා C
2. D හා E
3. B හා C
4. C හා D
5. A හා D

(.............)

08. පහත වගුවේ ව්‍යාපාර සංවිධාන වර්ග හා ඒවාට අදාල ලක්ෂණ දක්වා ඇත.

| ව්‍යාපාර සංවිධාන වර්ග | ලක්ෂණ |
|---|---|
| 1. වරලත් ව්‍යාපාර | A. ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර කටයුතු තහනම්ය. |
| 2. රාජ්‍ය සමාගම් | B. ප්‍රාග්ධනයක් රහිත ව ආරම්භ කළ හැකිය. |
| 3. ඇපයෙන් සීමිත සමාගම් | C. රජයේ පාලනය යටතේ පවතී. |
| 4. මිලකළ සමාගම් | D. කොටස් වෙළෙඳපලේ ලියාපදිංචි කරයි. |
| 5. අක්වෙරළ සමාගම් | E. ව්‍යාපාර නාමය පුරස්කාරයට යටත් වේ. |

ඉහත දී ඇති ව්‍යාපාර සංවිධාන වර්ග අනුපිළිවෙල අනුව ඒවායේ ලක්ෂණ නිවැරදි ව ගලපා ඇති පිළිතුර
වන්නේ,

1. EADCB
2. ECBDA
3. CDEBA
4. ACBDE
5. CDABE

(.............)

09. ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහනක දී දේශකයකු ලබාදුන් තොරතුරු අනුව ව්‍යවසායකයා යනු කවරෙක් ද යන්න පිළිබඳ ව අදහස් කිහිපයක් පහත දැක්වේ.

A - නව අදහස් හෝ නව සොයා ගැනීම් සාර්ථක ලෙස නව නිපැයුම් බවට පරිවර්තනය කිරීමට කැමති හා හැකියාවක් ඇති පුද්ගලයෙකි.
B - ලාභ ලැබීමේ අරමුණින් ව්‍යාපාරයකට ආයෝජනය කරන පුද්ගලයෙකි.
C - වැටුපකට වැඩ නොකරන ස්වයං සේවාවන්හි නියුක්ත පුද්ගලයෙකි.
D - ව්‍යාපාරයක ආයෝජනය කර කළමනාකරණ කටයුතුවල යෙදෙන පුද්ගලයෙකි
E - නව සංවිධානයක් නිර්මාණය කරන පුද්ගලයෙකි.
F - අවස්ථාවන් උදාකරගෙන ඉන් ප්‍රයෝජන ගැනීමට සංවිධානයක් නිර්මාණය කරන පුද්ගලයෙකි.

ඉහත ප්‍රකාශ අතරින් ව්‍යවසායකයා නිවැරදිව අර්ථ දක්වා ඇත්තේ,

1. A B C D
2. A B D E
3. A C E F
4. A C D E
5. B C D E

(.............)

10. ව්‍යවසායකත්ව ක්‍රියාවලියේ පියවර පිළිවෙලින් දැක්වෙන්නේ,

1. නව්‍යතා සොයාගැනීම, සංකල්ප ගොඩනැගීම හා සැලැස්ම සැකසීම, යථාර්තයක් බවට පත්කර ගැනීම, ක්‍රියාවට නැංවීම ප්‍රතිලාභ ලැබීම
2. නව්‍යතා සොයාගැනීම, යථාර්තයක් බවට පත්කර ගැනීම, අවශ්‍ය සම්පත් සොයා ගැනීම, ප්‍රතිලාභ ලැබීම, සංකල්ප ගොඩනැගීම
3. සංකල්ප ගොඩනැගීම, අවශ්‍ය සම්පත් සම්පාදනය, නව්‍යතා සොයාගැනීම, ප්‍රතිලාභ ලැබීම, යථාර්තයක් බවට පත්කිරීම
4. නව්‍යතා සොයාගැනීම, සංකල්ප ගොඩනැගීම හා ව්‍යාපාර සැලැස්ම සැකසීම, අවශ්‍ය සම්පත් සම්පාදනය, යථාර්තයක් බවට පත්කිරීම, ප්‍රතිලාභ ලැබීම
5. නව්‍යතා සම්පාදනය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පසුබිම, ක්‍රියාවට නැංවීම, වර්ධනය හා ප්‍රතිලාභ ලැබීම

(.............)

11. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයක් සාර්ථක වීමට අවශ්‍ය මූලික කොන්දේසි කිහිපයක් පහත වේ. ඒවා අතරින් අත්‍යවශ්‍ය නොවන කොන්දේසියක් විය හැක්කේ,

1. තමා පිළිබඳව හා තම ව්‍යාපාරය පිළිබඳව තේරුම් ගැනීම.
2. මනා කළමනාකාරීත්වයක් පවත්වා ගැනීමට ඇති හැකියාව හා වෙළෙඳපොළ පිළිබඳ දැනුම ලබාගැනීම.
3. ව්‍යාපාරය පිහිටා ඇති ප්‍රදේශයේ බල අධිකාරියක් යටතේ ලියාපදිංචිය ලබාගැනීම.
4. විවිධ රාජ්‍ය හා පෞද්ගලික ආයතනවලින් ලබාගත හැකි මූල්‍ය සහනයන්.
5. ව්‍යාපාර පරිසරය හා ප්‍රජාව පිළිබඳ අවබෝධය.

(.............)

12. ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය තුළ ක්‍රියාත්මක ආයතන කිහිපයකක් පහත දැක්වේ.

| | | | | | |
|---|---|---|---|---|---|
| A | - | ශ්‍රී ලංකා මහ බැංකුව | B | - | බලපත්‍රලාභී වාණිජ බැංකු |
| C | - | විශේෂිත කල්බදු සමාගම් | D | - | රක්ෂණ සමාගම් |
| E | - | සේවක අර්ථසාධක අරමුදල | F | - | ප්‍රාථමික අලෙවිකරුවන් |
| G | - | සමූපකාර ග්‍රාමීය බැංකු | H | - | ලියාපදිංචි මූල්‍ය සමාගම් |

ඉහත මූල්‍ය ආයතන බැංකු අංශය, තැන්පතු භාර ගන්නා අනෙකුත් ආයතන, විශේෂිත මූල්‍ය ආයතන හා ගිවිසුම්ගත ඉතිරිකිරීම් ආයතන ලෙස පිළිවෙළින් වර්ග කළ විට නිවැරදි පිළිතුර වන්නේ,

1. A, C, B, D, E, G, F, H
2. A, B, C, D, E, F, G, H
3. B, E, A, D, C, F, G, H
4. A, B, G, H, C, F, D, E
5. C, D, G, F, A, E, D, H

(.............)

13. මිතුරියන් දෙදෙනෙකු වන ප්‍රියංගනී සහ නිලංගනී දෙදෙනාගෙන් ප්‍රියංගනීට ණයපතක් ඇතත් නිලංගනීට ඇත්තේ හරපතකි. ගනුදෙනු කිරීමේ දී ප්‍රියංගනීට නොලැබෙන නිලංගනීට පමණක් ලැබෙන වාසියක් නම්,

1. පොළියක් ගෙවීමට සිදුනොවීම.
2. කිසියම් කාලයක් සඳහා ණය මුදලක් ලබා ගත හැකිවීම.
3. බැංකු ගිණුමේ ශේෂය ඉක්මවා කටයුතු කළ හැකිවීම.
4. බැංකු ගිණුමක් පවත්වාගෙන යාම අනිවාර්ය නොවීම.
5. දවසේ පැය 24 පුරාම ගනුදෙනු කළ හැකිවීම.

(.............)

14. කල්හාර රුපියල් මිලියන 20 වටිනා සිය මෝටර් රථය මිලියන 15 කට රක්ෂණය කර තිබුණි. ඔහුගේ අධික වේගය හේතුවෙන් සිදු වූ රිය අනතුරකින් මෝටර් රථයට මිලියන දෙකක හානියක් වී ඇති බවට තක්සේරු කර ඇත. ඔහුට රක්ෂණ ආයතනයෙන් ලැබෙන වන්දි මුදල කොපමණ ද?

1. මිලියන 3
2. මිලියන 1.5
3. මිලියන 15
4. මිලියන 2
5. නොසැලකිලිමත්කම නිසා වන්දි හිමිනොවේ.

(............)

15. සන්නිවේදනයේ දී පණිවුඩය සම්බන්ධ ''පූර්ණ බව'' යන්නෙන් අදහස් කරනුයේ,

1. අවශ්‍ය තොරතුරු ඇතුළත් කරමින් පණිවුඩය සකස් කිරීමයි.
2. යෝග්‍ය භාෂා මට්ටමක් භාවිතා කිරීමයි.
3. නිවැරදි ශිල්පක්‍රම යොදා ගනිමින් පණිවුඩය සකස් කිරීමයි.
4. හුරුපුරුදු වචන භාවිතාකොට පණිවුඩය සකස් කිරීමයි.
5. ප්‍රතිචාර ලබාගත හැකි ආකාරයට පණිවුඩය සකස් කිරීමයි.

(............)

16. ගුවන්යානා නිෂ්පාදන ආයතනයක ඊට අවශ්‍ය ද්‍රව්‍ය හා සැපයුම් සේවා සපයා ගැනීමට හා ඒවා වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම සඳහා භාවිතා කල හැකි ප්‍රවාහන හා සැපයුම් සේවා පද්ධතිය වන්නේ,

1. සමබර වූ ප්‍රවාහන හා සැපයුම් සේවා පද්ධති
2. නිෂ්පාදනයෙන් පසු අවසන් පාරිභෝගිකයා අතට පත්කිරීම සංකීර්ණ වූ පද්ධති
3. නිෂ්පාදිත අලෙවියෙන් පසු ආපසු ප්‍රවාහනය සහිත පද්ධති
4. නිෂ්පාදන ක්‍රියාවලිය දක්වා ප්‍රවාහනය සංකීර්ණ වූ පද්ධති
5. ඉහත කිසිවක් නොවේ.

(............)

17. ගනුදෙනුවට අදාළ ගැනුම්කරු හා විකිණුම්කරු සම්මුඛ කරමින් ගනුදෙනුව සිදුවීමට අවශ්‍ය තොරතුරු සපයමින් ගාස්තුවක් ලබා ගන්නා නියෝජිතයා,

1. කොමිස් නියෝජිතයා
2. තැරැව්කරු
3. සාධ්‍යකයා
4. කැපකරු නියෝජිතයා
5. වෙන්දේසිකරු

(............)

18. ජාත්‍යන්තර වෙළෙඳාමේ දී භාවිතාවන ලියවිලි සහ ඒවා සම්බන්ධ වැදගත්කම පිළිබඳව පහත දක්වේ.

| ලියවිලි | වැදගත්කම |
|---|---|
| 1. භානිරක්ෂණ ලිපිය | A. අපනයන භාණ්ඩවල වටිනාකම අපනයනකරුට ලිබීම තහවුරු වීම |
| 2. සනීපාරක්ෂක සහතිකය | B. වරණීය තීරුබදු ලබාගැනීමට උපකාරී වීම |
| 3. ප්‍රභවස්ථාන සහතිකය | C. දූෂ්‍ය නෞභාරපතක් වෙනුවට පාරිශුද්ධ නෞභාරපතක් ලබා ගැනීමට උදව් වීම |
| 4. ණයවර ලිපිය | D. ඇතැම් කෘෂි නිෂ්පාදන වල යෝග්‍යතාව සහතික කිරීම |

ඉහත දී ඇති ලියවිලි අනුපිළිවෙල අනුව අදාළ විස්තර නිවැරදිව ගලපා ඇති වරණය තෝරන්න.

1. C, D, B, A
2. C, B, A, D
3. A, C, B, D
4. A, B, C, D
5. B, A, C, D


(............)

19. ''විද්‍යුත් වෙළෙඳාම'' වඩාත් හොඳින් විස්තර කෙරෙන්නේ,

1. ව්‍යාපාර ගිණුම් පිළියෙල කිරීම සඳහා මෘදුකාංග භාවිතා කිරීම යන්නයි.
2. ගනුදෙනු සඳහා විද්‍යුත් මුදල් භාවිතා කිරීම යන්නයි.
3. සමස්ථ ව්‍යාපාර කටයුතු මෙහෙය වීමට විද්‍යුත්ජාල භාවිතා කිරීම යන්නයි.
4. භාණ්ඩ හා සේවා මිලදී ගැනිම හා විකිණීමේ කටයුතු අන්තර්ජාල ප්‍රමුඛ පරිගණකගත තොරතුරු පද්ධතිය හරහා සිදු කිරීමයි.
5. ව්‍යාපාරික කටයුතු සඳහා තොරතුරු තාක්‍ෂණය යොදා ගැනීමයි.

(............)

20. පහත දැක්වෙන්නේ එක්තරා ආයතනයකට අදාල සංවිධාන සටහනකි.




ඉහත ආයතනය සම්බන්ධයෙන් ප්‍රකාශ කළ හැක්කේ,

1. පරිපාලන වියදම් පහළ මට්ටමක පවතින බව
2. සේවක පාලනය පහසු බව
3. පහළට ගලායන සන්නිවේදනය දුෂ්කර බව
4. පුළුල් පාලන අවකාශයක් බව
5. තීරණ ගැනීම වේගවත් බව

(............)

21. සුමිත් කෝරලගේ ප්‍රධාන පෙළේ සමාගමක ඉහළ කළමනාකරණ බලතල හිමි නිලධාරියෙකි. ඔහු බොහෝ විට ගන්නා තීරණ පිළිබඳ පහළ පෙළ කළමනාකරුවන්ගෙන් මෙන් ම විවිධ තනතුරුවල නියුතු සේවකයන්ගෙන් ද අදහස් විමසීමත් කරයි. එසේ තීරණ ගැනීම කෙරෙහි යොමු වන සුමිත් පහත කවර නායකත්ව ශෛලියකින් යුත් නිලධාරියෙක් ද?

1. ඒකාධිපති නායකත්ව ශෛලියෙන් යුත් නිලධාරියෙකි.
2. ප්‍රජාතන්ත්‍රවාදී නායකත්ව ශෛලියෙන් යුත් නිලධාරියෙකි.
3. නිර්බාධවාදී නායකත්ව ශෛලියෙන් යුත් නිලධාරියෙකි.
4. කාර්ය අභිමුඛ නායකත්ව ශෛලියෙන් යුත් නිලධාරියෙකි.
5. සේවක අභිමුඛ නායකත්ව ශෛලියෙන් යුත් නිලධාරියෙකි.

(............)

22. පහත දැක්වෙන්නේ කළමනාකරණ පාලනය සඳහා භාවිතා කරන ක්‍රම කිහිපයකි.

| | | | | | |
|---|---|---|---|---|---|
| A | - | සේවක අධීක්‍ෂණය | B | - | සේවක කාර්ය සාධනය ඇගයීම |
| C | - | අවසන් නිමැවුම් පරීක්‍ෂාව | D | - | යන්ත්‍ර අළුත්වැඩියාව |
| E | - | අයවැය සැකසීම | F | - | තත්ත්ව පාලනය |

ඉහත ක්‍රම අතරින් සහගාමී පාලනය සඳහා භාවිතා කල හැකි ක්‍රම වනුයේ,

1. C හා D  2. D හා F  3. B හා D
4. A හා F  5. A හා C

(............)

23. ක්‍රියාවලිය පිරියත සැලසුම් ක්‍රමය වඩාත් යෝග්‍ය වන්නේ මින් කවර නිෂ්පාදිතයක් සම්බන්ධයෙන් ද?

1. මෝටර් රථ
2. ඇඟලුම් නිෂ්පාදිතය
3. ගෘහ භාණ්ඩ නිෂ්පාදනය
4. ගොඩනැගිලි ඉදිකිරීම
5. නැව් නිෂ්පාදනය

(............)

24. පහත දැක්වෙන්නේ නිෂ්පාදන ආයතනයක නිෂ්පාදන ක්‍රම හා ඒ හා බැඳුණු ලක්ෂණයන්ය.


| නිෂ්පාදන ක්‍රම | ලක්ෂණ |
|---|---|
| A කාර්ය නිෂ්පාදනය | 1 පිරිවැය ඉතා ඉහළය<br>2 නිෂ්පාදන පරිමාව ඉහළය |
| B සමූහ නිෂ්පාදනය | 3 වෙළෙඳපොළ ඉල්ලුම නොසලකයි.<br>4  රැකියා විශේෂීකරණයට මුල්තැන හිමිවේ |
| C ප්‍රවාහ නිෂ්පාදනය | 5 සම්පත් නාස්තිය මධ්‍යස්තයි<br>6 පිරිවැය ඉතා පහළය |

ඉහත තීරු නිවැරදිව ගලපා ඇති පිළිතුර තෝරන්න.

1. A - 1 , 2 B - 3 , 4 C - 5 , 6
2. A - 1 , 4 B - 2 , 6 C - 3 , 5
3. A - 2 , 3 B - 4 , 5 C - 1 , 6
4. A - 5 , 6 B - 1 , 2 C - 3 , 4
5. A - 1 , 4 B - 3 , 5 C - 2 , 6

(............)

25. සාකල්‍යවාදී අලෙවිකරන සංකල්පයට අයත් ප්‍රධාන විචල්‍යයන් ආශ්‍රිත සටහනක් පහත දැක්වේ.




ඉහත සටහනේ A, B, C, D වලින් කියවෙන්නේ සාකල්‍යවාදී අලෙවිකරණයේ කවර අංශදැයි අනුපිළිවෙළ දැක්වෙන පිළිතුර තෝරන්න.

1. සමෝධානික අලෙවිකරණය, අභ්‍යන්තර අලෙවිකරණය, කාර්යසාධන අලෙවිකරණය, සම්බන්ධතා අලෙවිකරණය
2. අභ්‍යන්තර අලෙවිකරණය, කාර්යසාධන අලෙවිකරණය, සම්බන්ධතා අලෙවිකරණය, සමෝධානික අලෙවිකරණය
3. කාර්යසාධන අලෙවිකරණය, සමෝධානික අලෙවිකරණය, අභ්‍යන්තර අලෙවිකරණය, සම්බන්ධතා අලෙවිකරණය
4. සම්බන්ධතා අලෙවිකරණය, අභ්‍යන්තර අලෙවිකරණය, කාර්යසාධන අලෙවිකරණය, සමෝධානික අලෙවිකරණය
5. කාර්යසාධන අලෙවිකරණය, සම්බන්ධතා අලෙවිකරණය, අභ්‍යන්තර අලෙවිකරණය, සමෝධානික අලෙවිකරණය

(............)

26. පහත වගුවේ X තීරුවේ ප්‍රවර්ධන මිශ්‍රයේ ප්‍රභේදයන් හා Y තීරුවේ ඊට අදාළ උපකරණයන් ඇතුලත් වේ.

| X තීරුව | Y තීරුව |
|---|---|
| A විකුණුම් ප්‍රවර්ධනය<br>B මහජන සම්බන්ධතා<br>C ඉසව් හා අත්දැකීම් | 1 මිල ගොනුව<br>2 ආයතනික චාරිකා<br>3 සාම්පල් බෙදා දීම<br>4 ප්‍රකාශන<br>5 පාඨමාලා<br>6 අනුග්‍රාහකත්ව |

X හා Y තීරු ගැලපූවිට නිවැරදි කාණ්ඩ ඇතුළත් පිළිතුර තෝරන්න.

1. A - 1 , 2 B - 4 , 6 C - 3 , 5
2. A - 3 , 4 B - 1 , 2 C - 5 , 6
3. A - 4 , 6 B - 2 , 3 C - 1 , 5
4. A - 1 , 3 B - 4 , 6 C - 2 , 5
5. A - 3 , 5 B - 1 , 4 C - 2 , 6

(.............)

27. පහත දැක්වෙන්නේ අරමුදල් සම්පාදන මාර්ග කිහිපයකි.

A - රඳවාගත් ලාභ B - කොටස් නිකුතුව
C - ගෙවිය යුතු වියදම් D - වෙළෙඳ ණය

විවිධ නිර්ණායක යටතේ ඉහත දෑ වර්ග කළ විට පහත සඳහන් කුමන පිළිතුර නිවැරදි වේ ද?

1. A හා D අභ්‍යන්තර මූල්‍ය සම්පාදන මාර්ග වන අතර B හා C බාහිර මූල්‍ය සම්පාදන මාර්ග වේ.
2. A හා B ඍජු මූල්‍ය සම්පාදන මාර්ග වන අතර C හා D කෙටි කාලීන මූල්‍ය සම්පාදන මාර්ග වේ.
3. A හා D අභ්‍යන්තර මූල්‍ය සම්පාදන මාර්ග වන අතර B හා C වක්‍ර මූල්‍ය සම්පාදන මාර්ග වේ.
4. A හා B වක්‍ර මූල්‍ය සම්පාදන මාර්ග වන අතර C හා D ඍජු මූල්‍ය සම්පාදන මාර්ග වේ.
5. A හා C ඍජු මූල්‍ය සම්පාදන මාර්ග වන අතර B හා D බාහිර මූල්‍ය සම්පාදන මාර්ග වේ.

(.............)

28. පහත දැක්වෙන්නේ මූල්‍ය අනුපාත කිහිපයකි.

A - ණය අනුපාතය B - තොග පිරිවැටුම් අනුපාතය
C - ණය ස්කන්ධ අනුපාතය D - ආයෝජන මත ප්‍රතිලාභ අනුපාතය
E - ණයගැති පිරිවැටුම් අනුපාතය F - පොළී ආවරණ අනුපාතය

ඉහත අනුපාත අතුරින් මූල්‍ය ස්ථාවරත්ව අනුපාත යටතට ගැනෙන්නේ,

1. B, C හා D ය
2. C, D හා E ය
3. B, C හා F ය
4. C, E හා F ය
5. A, C හා D ය

(.............)

29. යම්කිසි රැකියාවක් සඳහා ඉතාමත් යෝග්‍ය වන්නේ කවර ආකාරයේ පුද්ගලයෙක් ද යන්න විස්තර කෙරෙන ලියවිල්ල වන්නේ,

1. රැකියා පිරිවිතරය
2. රැකියා විස්තරය
3. රැකියා නිර්මාණය
4. රැකියා ඇගයීම
5. රැකියා ප්‍රසාරණය

(............)

30. පහත දැක්වෙන්නේ රැකියා විශ්ලේෂණයේ දී අවධානය යොමු කරන කරුණු කිහිපයකි.

| | | | | | |
|---|---|---|---|---|---|
| A | - | අධ්‍යාපන සුදුසුකම් | B | - | සේවා කාලය |
| C | - | වෘත්තීය සුදුසුකම් | D | - | කාර්ය, යුතුකම් හා වගකීම් |
| E | - | පුහුණුව හා පලපුරුද්ද | F | - | සුපරීක්ෂණ හා ඇගයීම් ක්‍රියාපටිපාටිය |
| G | - | සේවා දෙපාර්තමේන්තු | H | - | වගකිව යුතු නිලධාරීන් |

ඉහත කරුණු අතුරින් රැකියා විස්තරයට පමණක් ඇතුළත් කරණු අඩංගු පිළිතුර වන්නේ,

1. A, B, C, D, H
2. B, D, F, G, H
3. B, C, E, F, G
4. A, D, E, F, G
5. A, C, D, E, F

(............)
(ල.2x30)

- **ප්‍රශ්න අංක 31-40 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**

31. ආ) යම්කිසි මූලික තෘප්තියක් නොලැබීම නිසා දැනෙන අඩුපාඩුවක් පිළිබඳ හැඟීම මිනිස් ............................ ලෙස හඳුන්වන අතර, කිසියම් නිෂ්පාදිතයක් මිල දී ගැනීමට කැමති මිල දී ගැනීමේ ශක්තියක් ඇති ප්‍රමාණවත් පාරිභෝගික ඉල්ලුම ........................................................................................ලෙස හඳුන්වයි.

ආ) ස්ත්‍රී පුරුෂ භාවය, අධ්‍යාපන මට්ටම හා පවුල් සංයුතිය ආදිය ........................................ පරිසරයට අයත් සාධක වන අතර සංවිධානය තුළ සිටින එයට බලපෑම් කරන කණ්ඩායම් තත්වයන් ව්‍යාපාරයක ...................................................................... වේ.

32. වරලත් ගිවිසුම තුළ ව්‍යාපාරය පවත්වාගෙන යාමට අදාළ ...................................... , ................................ ........................ , ............................................................. හා ............................................................ සඳහන් වේ.

33. අ) අපනයන සංවර්ධන මණ්ඩලය මගින් කුඩා ව්‍යාපාර සඳහා ලබාදෙන දිරිගැන්වීම් ...................................... සහ .......................................... වශයෙන් දැක්විය හැකිය.

ආ) සූක්ෂම කර්මාන්ත නායකත්ව හා ව්‍යවසායකත්ව ප්‍රවර්ධන ණය යෝජනා ක්‍රමයට ................................ ..............................................................................මූල්‍ය අනුග්‍රහය දක්වන අතර ............................................... ප්‍රතිමූල්‍ය පහසුකම් සපයයි.

34. අ) තත්කාලීන දළ පියවුම් පද්ධතිය හා ලේඛන රහිත සුරකුම් තැන්පතු පද්ධතිය එක් ව ගත්කල එය හැඳින්වීමට යොදන නම ........................................................................................ වේ.

ආ) ඇමරිකාවේ නිව් හැම්ෂයර් ප්‍රාන්තයේ බ්‍රේට්න් වුඩ්ස් නගරයේ පවත්වන ලද සම්මේලනයට අනුව 1947 දෙසැම්බර් 27 වන දින ................................................................ ආරම්භ කරන ලදි.

35. අ) ජාත්‍යන්තර වෙළෙඳාම ලිහිල් කිරීමට හා සුපරීක්ෂණය සඳහා ස්ථාපිත කරන ලද ජාත්‍යන්තර සංවිධානයක් ලෙස ............................................................................ හැඳින්විය හැකි අතර එහි ප්‍රධාන කාර්යාලය ..................................................................................................... පිහිටුවා ඇත.

ආ) ආසියා පැසිපික් වෙළෙඳ ගිවිසුම ( APTA ) ................................................................... නමින් ආරම්භ වූ අතර ආසියා පැසිපික් කලාපයේ ඇති පැරණි ම ........................................................ වන්නේ මෙම ගිවිසුමයි.

36. අ) ආයතනයක සත්‍ය ප්‍රතිඵල ......................................................... සමග සැසඳීමෙන් විචලනයන් වෙතොත් ඒවා හඳුනාගෙන ඒවා ....................................................................................................... ගැනීම පාලනයෙන් සිදු වේ.

ආ) සේවකයෙකුට පවරා ඇති කාර්යය හෝ කටයුතු ඉටුකිරීමේ සේවක යුතුකම ....................................... වන අතර පවරන ලද කාර්යය ඉටුකිරීම සම්බන්ධයෙන් ඉහළ කළමනාකරණයට බැඳී සිටීම හා ප්‍රතිඵල අඩු වුවහොත් සාධාරණීකරණය කිරීම .................................................................. යි.

37. අ) පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීමට නිෂ්පාදිතයකට ඇති හැකියාව............................ ................................... ලෙස හැඳින්වෙන අතර නිෂ්පාදන ආයතනයක් ස්ථාපිත ප්‍රමිතවලට අනුව සිදුවන්නේ ද යන්න තහවුරු කර ගැනීමේ ක්‍රියාවලිය ........................................................... නම් වේ.

ආ) නිෂ්පාදන ආයතනයක සෑම නිෂ්පාදිතයක්ම දෝෂවලින් තොරව නිෂ්පාදනය කෙරෙන බව සහතික කිරීම ............................................................................... ලෙස හැඳින්වේ. යම් වරදක් වැලැක්විය නොහැකියයි පිළිගැනීමට වඩා .................................................................. වගබලා ගැනීම මෙම ශිල්පීය ක්‍රමයෙන් අපේක්ෂා කෙරේ.

38. යෝග්‍ය බෙදාහැරීමේ මාර්ගයක් තීරණය කිරීමේ දී ............................................................ , ........................ .............................................. , .................................................................. , .............................................. යන කරුණු කෙරෙහි අවධානය යොමු කළ යුතුවේ.

39. අ) මූල්‍ය පද්ධතිය තුළ සිදුවන ප්‍රධාන හා වැදගත් කාර්යය වන්නේ ....................................................................... යි.

ආ) ශ්‍රී ලංකා මහ බැංකුව මූල්‍යායතන වර්ග කිරීමේ දී බැංකු අංශය ................................................................ , .......................................................................... සහ ........................................................................ ලෙස වර්ග කර ඇත.

40. ආකර්ෂණයට බලපාන වැදගත්ම සාධකය වනුයේ ............................................................ යි. ඊට අමතර ව ............................................................ , ............................................................ , ............................................................ ආදිය ද සලකා බලයි.

(ල.2x10)

- **41-50 දක්වා ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරිමත ලියන්න.**

41. ආචාරධර්ම සංග්‍රහය මඟින් ව්‍යාපාරයක් අපේක්ෂා කරන ප්‍රතිලාභ හතරක් නම් කරන්න.

1) ............................................................

2) ............................................................

3) ............................................................

4) ............................................................

42. රජය ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට ඉවහල් වී ඇති හේතු 04 ලියන්න.

1) ............................................................

2) ............................................................

3) ............................................................

4) ............................................................

43. ව්‍යවසායකත්ව සංවර්ධනයට එරෙහි ව පැවතිය හැකි අභියෝග/තර්ජන හතරක් ලියන්න.

1) ............................................................

2) ............................................................

3) ............................................................

4) ............................................................

44. බැංකු ණයක් ලබා ගැනීමේ දී මූල්‍ය ආයතනයක් සලකා බලනු ලබන ප්‍රධාන සාධක 04 සඳහන් කරන්න.

1) ............................................................

2) ............................................................

3) ............................................................

4) ............................................................

45. නැව්කඳ රක්ෂණය යටතේ ලබාගත හැකි රක්ෂණ ඔප්පු වර්ග 04 ක් සඳහන් කරන්න.

1) ............................................................

2) ............................................................

3) ............................................................

4) ............................................................

46. සන්නිවේදනය සඳහා සංඥා ශබ්ද හා සංකේත යොදාගනු ලබන අවස්ථා කවරේ ද?

1) ..............................................................................................................................

2) ..............................................................................................................................

3) ..............................................................................................................................

4) ..............................................................................................................................

47. පහත ලියවිලි නිකුත් කරන ආයතන නම් කරන්න.

| ලියවිල්ල | නිකුත් කරන ආයතනය |
| --- | --- |
| 1) විදේශ ගමන් බලපත්‍රය | .................................................................................... |
| 2) රියදුරු බලපත්‍රය | .................................................................................... |
| 3) නෞභාර පත්‍රය | .................................................................................... |
| 4) වාහන ආදායම් බලපත්‍රය | .................................................................................... |

48. එක්තරා නිෂ්පාදන ආයතනයක මසක් තුළ ඇස්තමේන්තු නිෂ්පාදන ඒකක සංඛ්‍යාව සත්‍ය නිෂ්පාදන ඒකක සංඛ්‍යාව හා සමාන විය. එසේ වීමට හේතු 04 ක් ලියන්න.

1) ..............................................................................................................................

2) ..............................................................................................................................

3) ..............................................................................................................................

4) ..............................................................................................................................

49. පැකට් කළ ආහාර ද්‍රව්‍ය නිෂ්පාදන ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කරන ප්‍රසන්න නැමති ව්‍යාපාරිකයාට ලබා ගත හැකි ප්‍රමිති වර්ග මොනවා ද?

1) ..............................................................................................................................

2) ..............................................................................................................................

3) ..............................................................................................................................

4) ..............................................................................................................................

50. පහත සඳහන් එක් එක් සංකේතයේ අදහස ලියන්න.

1.

..........................................................................

2.

..........................................................................

3.

..........................................................................

4.

..........................................................................

(ල.2x10)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 13 ශ්‍රේණිය, දෙවන වාර පරීක්ෂණය, 2020 මාර්තු**

**General Certificate of Education (Adv. Level), Grade 13, Second Term Test, March 2020**

| | | |
|---|---|---|
| **ව්‍යාපාර අධ්‍යයනය - II**<br>**Business Studies - II** | 32 **S** **II** | පැය 03 යි විනාඩි 10<br>**Time:03hs & 10mts** |

විභාග අංකය : ....................................................................

**සැලකිය යුතුයි :**

- **'අ' කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද 'ආ' කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද තෝරා ගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

## අ කොටස

01) අ) අධික වේගයෙන් නාගරීකරණය වන ප්‍රදේශයක සිදු වූ සංවර්ධනයත් සමඟ අත්‍යාවශ්‍ය වන අවශ්‍යතාවන් සපුරාලීමට අවිශ්ක නම් තරුණ ව්‍යාපාරිකයා විසින් ''අවිශ්ක රස පියස'' නමින් භෝජනාගාරයක් හා බේකරියක් ආරම්භ කරයි. මෙම ප්‍රදේශයේ වෙනත් ආපනශාලා මෙන් ම කුඩා සිල්ලර වෙළෙඳසැල් වල ද ආහාරපාන අලෙවි කරයි. තම භෝජනාගාරයේ හා බේකරියේ සේවය කිරීමට හා තම නිෂ්පාදන බෙදාහැරීමට සේවකයන් දස දෙනෙකු ද බඳවා ගැනීමට පුවත්පත් දැන්වීමක් පළ කිරීමට ද ඔහු අදහස් කරයි.

i. ඉහත සිද්ධියට සම්බන්ධ අත්‍යවශ්‍ය ම අවශ්‍යතාව කුමක් ද? (ල.1/2)

ii. අවිශ්ක විසින් එම අවශ්‍යතාව සපුරා ගැනීමට කුමන නිෂ්පාදිත ලබා දේ දැයි උදාහරණ දෙකක් ලියන්න. (ල.1/2)

iii. අවිශ්කගේ ව්‍යාපාරය හා සම්බන්ධ සිද්ධියේ ඊට අදාළ උපකාරක සේවා 02 ක් සඳහන් කරන්න. (ල.01)

ආ) වර්තමාන ව්‍යාපාර ලෝකය තුළ ක්‍රියාත්මක වන ව්‍යාපාර බොහෝමයක් කොටස්කරු සංකල්පයෙන් ඉවත් වී ඇල්මැති පාර්ශව සංකල්පයට නැඹුරු වන්නේ කුමණ හේතු නිසාද යන්න පැහැදිලි කරන්න. (ල.02)

ii. අ) ඔබගේ පාසල කෙරෙහි ඇල්මැති පාර්ශව හඳුනාගෙන එම පාර්ශව අභ්‍යන්තර හා බාහිර ලෙස වර්ග කරන්න. (ල.02)

ආ) ඔබ විසින් සඳහන් කරන ලද පාර්ශව පාසලට වැදගත් වීමට හේතු සඳහන් කරන්න. (ල.02)

iii. අ) තිරසර සංවර්ධනය ළඟාකර ගැනීමට නම් ව්‍යාපාර ප්‍රධාන සාධක තුනක් කෙරෙහි අවධානය යොමු කළ යුතුය.
ඉහත සාධක තුන නම් කර ඉන් එක් සාධකයක් තහවුරු කිරීමට ව්‍යාපාරයකට ගත හැකි ක්‍රියාමාර්ග තුනක් සඳහන් කරන්න. (ල.02)

ආ) ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ රූපවාහිනී ආයතනයක් සෑම පාර්ශවයකටම යහපතක් වන ආකාරයට ආචාර ධර්ම පද්ධතියක් සකස් කරයි. එහි අඩංගු විය යුතු ආචාර ධර්ම හතරක් සඳහන් කරන්න. (ල.02)

iv. ව්‍යාපාර ආචාරධර්ම සංග්‍රහ යන්න හඳුන්වා එවැනි ආචාර ධර්ම සංග්‍රහයක වැදගත්කම පැහැදිළි කරන්න. (ල.04)

v. අපද්‍රව්‍ය කළමනාකරණය යන සංකල්පයේ අරමුණු මුදුන් පමුනුවා ගැනීමට භාවිතා කෙරෙන 4$^R$ සංකල්පයට අයත් විචල්‍යයන් නම් කර පැහැදිලි කරන්න. (ල.04)

02. i. අ) ''රජයේ ආර්ථික අරමුණු ඉටුකර ගැනීමට ව්‍යාපාර විවිධාකාරයෙන් දායක වේ.'' මෙම ප්‍රකාශය විමසන්න. (ල.02)

ආ) රජයේ පිස්කල් ප්‍රතිපත්තිය ව්‍යාපාරවලට බලපාන ආකාරය උදාහරණ දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල.02)

ii. අ) ''පාරිභෝගිකයා වර්තමානයේ දී තාර්කික පාරිභෝගිකයකු බවට පත් වී ඇත.'' මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ල.02)

ආ) පාරිභෝගිකයාට උසස් තත්ත්වයේ භාණ්ඩයක් ලබාදීම සහතික කරන ආයතනයක් ලෙස ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ඉමහත් කාර්යභාරයක් ඉටුකරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ කාර්යයන් 04 ක් ලියන්න. (ල.02)

iii. අ) ඔබේ මිතුරෙකු වූ කසුන් දසනායක විදේශගතව සිට පැමිණ නිමිඇඳුම් අලෙවිසැලක් ආරම්භ කිරීමට අපේක්ෂා කරන බවත් එය තනි පුද්ගල ව්‍යාපාරයක් ලෙස ආරම්භ කිරීමට කැමැත්තක් තිබුණ ද එසේ නොකර සීමිත පුද්ගලික සමාගමක් ලෙස ආරම්භ කිරීමට තීරණය කළ බවත් ප්‍රකාශ කළේය. ඔහුගේ එම තීරණය නිසා අත්වන වාසි හතරක් ලියන්න. (ල.02)

ආ) කසුන් දසනායක තම ව්‍යාපාරය ''කසුන් සමාගම'' ලෙස නම් කිරීමට අපේක්ෂා කරන බව ඔබ සමග පැවසුවේ නම් ඒ පිළිබඳ ව ඔබ දක්වන අදහස කුමක් ද? (ල.02)

iv. අ) ශ්‍රී ලංකාවේ සමුපකාර ව්‍යාපාරය ක්‍රියාත්මක වන ආකාරය අනුව එහි හඳුනාගත හැකි ගැටලු 04 ක් නම් කරන්න. (ල.02)

ආ) සමුපකාර ව්‍යාපාරයේ වාසි 04 ක් ලියන්න. (ල.02)

v. අ) i) ඇපයෙන් සීමිත සමාගමක් යනු කුමක් ද? (ල.01)

ii) ඇපයෙන් සීමිත සමාගමක දැකිය හැකි ලක්ෂණ මොනවා ද? (ල.01)

ආ) i) ''ව්‍යාපාර සංයෝජනය වී කටයුතු කිරීම'' යන්නෙහි අදහස පැහැදිලි කරන්න. (ල.01)

ii) ව්‍යාපාර සංයෝජනය වීම සිදු කළ හැකි ආකාරයක් නම් කර කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.01)

03. නිපුනි පරම්පරාවෙන් උරුමකරගත් ව්‍යාපාරික පවුලක එකම දියණියයි. ඇය තම පියාගේ ව්‍යාපාර කටයුතු වලට ඉතා ඕනෑකමින් සහභාගී වන්නේ ව්‍යාපාර අධ්‍යයනය විෂය හදාරා ඇති බැවින් ව්‍යාපාර පිළිබඳ මනා අවබෝධයක් ඇත්තියක බැවිනි. නිපුනි පියාගේ ව්‍යාපාරය නවීකරණය කොට වඩාත් ඉඩකඩ සහිත ස්ථානයක පවත්වාගෙන යන අතර ඊට විද්‍යුත් මුදල් පහසුකම් මෙන්ම රථවාහන අංගනයක් ද එක් කර ඇත.
දසුනි ද පාරම්පරික ව්‍යාපාරික පවුලකින් පැවත එන්නියක වුව ද ඇය සිය පවුලේ ව්‍යාපාර වලින් බැහැරව තමා විසින් ම නිෂ්පාදනය කළ කරපිංචා හා මුරුංගා කොළ වලින් සැදූ තේ කුඩු පැකට් කර අලෙවි කිරීමේ නිරත වෙයි.

i. අ) ඉහත ප්‍රකාශ අතරින් කියවෙන නිපුනි හා දසුනි යන දෙදෙනාගෙන් ව්‍යවසායකයකු ලෙස සැලකිය හැක්කේ කවරෙක් ද? (ල.01)

ආ) ඉහත ඔබ නම් කළ පුද්ගලයා ව්‍යවසායකයකු ලෙස සැලකීමට හේතු මොනවා ද? (ල.01)

ඇ) අනෙක් පාර්ශවය හැඳින්විය හැක්කේ කවරෙකු ලෙස ද? (ල.01)

ඈ) ව්‍යවසායකයා හා ව්‍යාපාරිකයා අතර වෙනස්කම් 02 බැගින් ලියන්න. (ල.01)

ii. අ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වලට ම සුවිශේෂී වූ ලක්ෂණ මොනවා ද? (ල.02)

ආ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දිරිමත් කිරීම සඳහා ක්‍රියාත්මක වන යෝජනා ක්‍රම 02 ක් නම් කර කවර අවශ්‍යතා සඳහා හඳුන්වා දී තිබේ ද? මූල්‍ය පහසුකම් සපයන්නනේ කවර පාර්ශවයන් ද? යන්න ඇතුලත් ව විස්තර කරන්න. (ල.02)

iii. අ) ඔබගේ මිතුරෙකු වන ලසන්ත හට ඔහුගේ ව්‍යාපාර කටයුතු කාර්යක්ෂමව කරගෙන යාම සඳහා ජංගම ගිණුමක් විවෘත කිරීමට පොළඹවන්නේ කෙසේ දැයි පැහැදිළි කරන්න. (ල.02)

ආ) ජංගම ගිණුමක් විවෘත කිරීමෙන් පසු චෙක්පත් ලිවීමේ දී සැලකිලිමත් වියයුතු කරුණු මොනවා දැයි ලසන්තට උපදෙස් ලබා දෙන්න. (ල.02)

iv. පහත සඳහන් පද පැහැදිළි කරන්න.

i. ලංකා සෙට්ල්
ii. ස්විෆ්ට්
iii. ලංකා සෙක්‍යුර්
iv. ස්ලිප්ස් (ල.1x4)

v. පහත දැක්වෙන චෙක්පතෙහි ආදර්ශයෙහි සඳහන් මූලිකාංග නම් කරන්න. (ල.04)




04. i. අ) රක්ෂණ ගිවිසුමක් වලංගු වීම සඳහා පැවතිය යුතු මූලිකාංග මොනවා ද? (ල.02)

ආ) ''රක්ෂණය මඟින් රක්ෂිත විෂය වස්තුවට සිදුවන හානිය වැලැක්වීමක් සිදු නොවන අතර හානියට පිළියමක් පමණක් ලබාදේ.'' මෙම ප්‍රකාශය පැහැදිළි කරන්න. (ල.02)

ii. අ) ලෝකයේ සංවර්ධිත රටවල මෙන් ශ්‍රී ලංකාවේ ද අධිවේගී මාර්ග ව්‍යාප්තිය වර්තමානයේ ක්‍රම ක්‍රමයෙන් වර්ධනය වෙමින් පවතී. මෙසේ අධිවේගී මාර්ග ඉදිකිරීමෙන් අත්වන ප්‍රතිලාභ සඳහන් කරන්න. (ල.02)

ආ) මාර්ග පද්ධතිය කොතෙක් පුළුල් කළ ද ශ්‍රී ලංකාවේ මහා මාර්ග තදබදය ඉතා ඉහළ මට්ටමක පවතී. මහා මාර්ග ප්‍රවාහනයේ පවතින මෙම දුර්වලතාවය මගහරවා ගැනීමට ඔබ කරන යෝජනා කවරේ ද? (ල.02)

iii. අ) ගබඩාවක් ස්ථානගත කිරීමේ දී සලකා බැලිය යුතු කරුණු දක්වන්න. (ල.1/2x4)

ආ) බොහෝ පාර්ශව කුරියර් සේවාව භාවිතයට ගනු ලබන්නේ කවර හේතු නිසාදැයි දක්වන්න. (ල.1/2x4)

iv. අ) සිල්ලර වෙළෙඳසැලකට පාරිභෝගිකයන් විශාල වශයෙන් ගෙන්වා ගැනීම සඳහා යොදාගත හැකි උපාය මාර්ග 04 ක් සඳහන් කරන්න. (ල.02)

ආ) වෙළෙඳසැල් රහිත සිල්ලර වෙළඳාම යනු කුමක් දැයි හඳුන්වා එහි ප්‍රධාන ආකාර 02 ක නම් කරන්න. (ල.02)

v. අ) වෙළෙඳ කලාප පිහිටුවා ගැනීමෙන් එහි සාමාජික රටවලට අත්වන ප්‍රතිලාභ 02 ක් කෙටියෙන් විස්තර කරන්න. (ල.02)

ආ) කුමාර, වැටකෙයියා වලින් සාදන ලද විසිතුරු භාණ්ඩ විදේශ වෙළෙඳපොළ වෙත ලබා දීමට අදහස් කරයි. ඒ පිළිබඳ අවශ්‍ය දැනුම ඔහු සතුව නැත. එම නිෂ්පාදිත අපනයනය කිරීමට අදාළ ක්‍රියාමාර්ගය පිළිබඳව පියවරෙන් පියවර පැහැදිළි කරන්න. (ල.02)

**<u>ආ කොටස</u>**

05. i. ගැටලුවක් ඇතිවන සෑම විටම ඊට විසඳුම් සෙවීම සඳහා තීරණ ගැනිම කළමනාකරුවන් විසින් සිදුකරනු ලබයි.ගැටලුව සරල වුවද සංකීර්ණ වුවද වඩා සාර්ථක වූ විසඳුමක් ගැනීම තුළින් අදාළ ගැටලුව වඩා හොඳින් විසඳාගත හැකිය.

අ) තීරණ ගැනීම යනු කුමක්දැයි හඳුන්වන්න. ල.02)

ආ) තීරණ ගැනීමේ ක්‍රියාවලියට අයත් පියවර නම් කරන්න. (ල.02)

ii. අ) සැලසුම්කරණය අනාගතය සඳහා වූ ක්‍රියාවලියක් බව හඳුන්වන්නේ ඇයි? (ල.02)

ආ) මනා සැලසුමක් තුලින් ආයතනයක අපේක්ෂිත තත්ත්වයන් පහසුවෙන් සාක්ෂාත් කරගත හැකි වේ.එවැනි සැලසුමක අඩංගු වියයුතු කරුණු 04 ක් දක්වන්න. (ල.02)

iii. ''අග්‍ර කළමනාකරුවන්ට අවශ්‍ය වන්නේ සංකල්පනාත්මක කුසලතා පමණි.'' ඉහත ප්‍රකාශය හා ඔබ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුර පහදන්න. (ල.04)

iv. 2020 වර්ෂයේ අප්‍රේල් මාසයට යෙදී ඇති සිංහල හා දෙමළ අලුත් අවුරුදු උත්සවය සංවිධානය කිරීම ඔබ නියෝජනය වන වාණිජ අංශයට පැවරී ඇතැයි සිතන්න.

අ) ඔබ සිංහල හා දෙමළ අවුරුදු උත්සවය සංවිධානය කිරීමේ පියවර පෙළ ගස්වන්න. (ල.02)

ආ) එක් එක් පියවරේ දී කළයුතු කාර්යයන් හා වගකීම් දැරිය යුතු පාර්ශවයන් ලැයිස්තුගත කරන්න. (ල.02)

v. අ) ඔබ පාසලේ සංවිධාන ව්‍යුහය තුළ වගකීම් හා බලතල බෙදී ඇති ආකාරය රූප සටහනකින් ඇඳ දක්වන්න. (ල.02)

ආ) ඉහත ඔබ විසින් අඳින ලද ඔබ පාසලේ සංවිධාන ව්‍යුහය තුළින් පිළිඹිබු වන මධ්‍යගතකරණය හා විමධ්‍යගතකරණ සංකල්ප වෙන් වෙන් ව පැහැදිළි කරන්න. (ල.02)

06. i. මෙහෙයුම් කළමනාකරණ කාර්යයන් ලෙස ද්‍රව්‍ය මිලදී ගැනීම ව්‍යාපාරයකට වැදගත් කාර්යයකි. නිෂ්පාදන ක්‍රියාවලියේ දී මිලදී ගැනීමේ කාර්යයට අදාළ ප්‍රධාන කොටස් වෙන් වෙන් වශයෙන් දක්වා ඊට උදාහරණ 02 ක බැගින් දෙන්න. (ල.04)

ii. අ) ව්‍යාපාරයකට තොග පාලනය අවශ්‍ය වන්නේ ඇයි? හේතු දක්වන්න. (ල.02)

ආ) තොග පාලනය සඳහා පරිගණක මෘදුකාංග යොදා ගැනීමෙන් අත්වන වාසි හා අවාසි 02 බැගින් ලියන්න. (ල.02)

iii. අ) මෙහෙයුම් කළමනාකරණයට අදාළ පරිවර්තන ක්‍රියාවලියේ ස්වභාවය රූප සටහනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල.02)

ආ) මෙහෙයුම් ක්‍රියාවලියට අයත් පිරියත සැලසුම් වර්ග නම් කරන්න. (ල.02)

iv. පෙර පාසල් සඳහා අවශ්‍ය මේස නිෂ්පාදන ආයතනයක මිලදී ගත් දැව සඳහා රු.80 000 ද තීන්ත හා වාර්නිෂ් සඳහා රු.40 000 ද වැය වේ යැයි අපේක්ෂා කරයි. මාසිකව නිපදවීමට අපේක්ෂිත මේස සංඛ්‍යාව 500 කි. එක් මේසයක් රු.650/= කට අලෙවි කිරීමට තීරණය කර ඇති අතර ලී ඉරන මැෂිම රු.45 000 ද නිෂ්පාදන සේවක වැටුප් රු.15 000 ද ගෙවනු ලබයි.

i) ව්‍යාපාරයේ මුළු විචල්‍ය පිරිවැය ගණනය කරන්න. (ල.01)
ii) ව්‍යාපාරයේ කාලච්ඡේදයට අදාළ මුළු පිරිවැය ගණනය කරන්න. (ල.01)
iii) ඒකකයක පිරිවැය ගණනය කරන්න. (ල.01)
iv) කාලච්ඡේදයට අදාළ ලාභය ගණනය කරන්න. (ල.01)

v. ව්‍යාපාර බොහෝමයක් වර්තමානයේ නව තාක්ෂණය යොදාගෙන ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම කෙරෙහි දැඩි නැඹුරුවක් පවතී. නව තාක්ෂණය යොදා ගැනීම තුලින් ව්‍යාපාර වල අත්වන ප්‍රතිලාභ හා නව තාක්ෂණය යොදා ගැනීමේ ගැටලු 04 බැගින් සඳහන් කරන්න. (ල.04)

07. i. ප්‍රචාරණය යනු පාරිභෝගිකයා වෙත සිය නිෂ්පාදිත ගෙන යාමයි. එහෙත් ප්‍රසිද්ධිය යනු පාරිභෝගිකයා නිෂ්පාදිත වෙත පැමිණීමයි.

අ) මෙම ප්‍රකාශය පිළිබඳ ඔබගේ අදහස දක්වන්න. (ල.01)

ආ) ප්‍රචාරණයේ මූලික අරමුණ තුනකි. ඒවා පැහැදිලි කරන්න. (ල.03)

ii. නිෂ්පාදිතයක මට්ටම් කිහිපයක් වේ. එම මට්ටම් අනුපිළිවෙලින් සඳහන් කර කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.04)

iii. අ) නිෂ්පාදිතයක් යනු භාණ්ඩ හා සේවා පමණක් නොව ඉන් ඔබ්බට පුළුල් පදනමකින් ප්‍රකාශ කළ හැකිය. එම වර්ගීකරණය සඳහන් කර ඉන් හතරක් පැහැදිලි කරන්න. (ල.02)

ආ) නිෂ්පාදිතයක් සඳහා ඇසුරුමක් සැලසුම් කිරීමේ දී සැලකිය යුතු කරුණු 04 ක් සඳහන් කරන්න. (ල.02)

iv. අ) නිෂ්පාදිත ප්‍රවර්ධනයේ ඇති වැදගත්කම සඳහන් කරන්න. (ල.02)

ආ) මිල කිරීමේ පරමාර්ථ 04 ක් සඳහන් කරන්න. (ල.02)

v. අ) භාණ්ඩ අලෙවිකරණ මිශ්‍රයට අමතර සේවා අලෙවිකරණ මිශ්‍රයේ ඇතුලත් විචල්‍යයන් නම් කර එක් එක් විචල්‍යයන් හඳුන්වන්න. (ල.02)

ආ) වෙළෙඳපොළ බණ්ඩනය සඳහා යොදාගන්නා පදනම් සඳහන් කර එක් එක් පදනමට අදාළ උදාහරණ 02 ක බැගින් සඳහන් කරන්න. (ල.02)

08. i. අ) මුදල් අයවැය ලේඛනයක දැකිය හැකි අපේක්ෂිත මුදල් ලැබීම් මාර්ග හා අපේක්ෂිත මුදල් ගෙවීම් මාර්ග දෙකක් සඳහා උදාහරණ 02 ක බැගින් දක්වන්න. (ල.02)

ආ) මූල්‍ය කළමනාකරණයේ ප්‍රධාන අරමුණු මොනවා ද? (ල.02)

ii. පහත සඳහන් මූල්‍ය අනුපාත ගණනය කරන ආකාරය ලියා දක්වන්න.

i) ක්ෂණික අනුපාතය

ii) ශුද්ධ ලාභ අනුපාතය

iii) තොග පිරිවැටුම් අනුපාතය

iv) පොළී ආවරණ අනුපාතය (ල.1x4)

iii. අ) භාණ්ඩාගාර බිල්පත් මිළට ගැනීමෙන් ගැනුම්කරුට ලබාගත හැකි වාසි මොනවා ද? (ල.02)

ආ) භාණ්ඩාගාර බැඳුම්කර යනු කුමක් දැයි හඳුන්වා ඒවාට ආවේනික ලක්ෂණ 02 ක් ලියන්න.(ල.02)

iv. අ) මානව සම්පත් ඉල්ලුම පුරෝකථනය කිරීමේ දී අවධානය යොමු කළ යුතු සාධක මොනවා ද? (ල.02)

ආ) ''ව්‍යාපාරයක් බාහිරින් සේවකයන් ආකර්ෂණය කර ගැනීමේ දී වාසි මෙන්ම අවාසි ද අත්විඳීමට සිදු වේ'' මෙම ප්‍රකාශය විමසන්න. (ල.02)

v. රටපුරා විහිදුනු නිමි ඇඳුම් අලෙවිකරණ ව්‍යාපාර ආයතනයක ශාඛාවන් කිහිපයක් සඳහා මුදල් අයකැමි තනතුර සඳහා සේවක සේවිකාවන් බඳවා ගැනීම සඳහා අවශ්‍යවන රැකියා විස්තරයක් පිළියෙල කරන්න.

(ල.04)

## දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**දෙවන වාර පරීක්ෂණය - 2020**

**13 ශ්‍රේණිය**

**ව්‍යාපාර අධ්‍යනය පිළිතුරු**

**I පත්‍රය**

| | | | |
|---|---|---|---|
| 01 - 4 | 11 - 3 | 21 - 2 | |
| 02 - 3 | 12 - 4 | 22 - 4 | |
| 03 - 4 | 13 - 1 | 23 - 3 | |
| 04 - 3 | 14 - 2 | 24 - 5 | |
| 05 - 1 | 15 - 1 | 25 - 5 | |
| 06 - 4 | 16 - 4 | 26 - 4 | |
| 07 - 4 | 17 - 2 | 27 - 2 | |
| 08 - 2 | 18 - 1 | 28 - 3 | |
| 09 - 3 | 19 - 4 | 29 - 1 | |
| 10 - 4 | 20 - 3 | 30 - 2 | **(ල.2x30=60)** |

31. අ) අවශ්‍යතා, සඵලදායී ඉල්ලුම
    ආ) ප්‍රජා, අභ්‍යන්තර පරිසරය

32. නීතිරීති
    මූල්‍ය කොන්දේසි
    වරලත්ලාභියා ගෙවියයුතු මූලික ගාස්තුව
    පුරස්කාරය

33. අ) අලෙවි පහසුකම්, උපදේශන සේවා
    ආ) JBIC (අන්තර්ජාතික සහයෝගීතාව සඳහා ජපාන බැංකුව)
    ජාතික සංවර්ධන බැංකුව

34. අ) ලංකා සෙට්ල්
    ආ) ලෝක බැංකුව

35. අ) ලෝක වෙළෙඳ සංවිධානය, ස්විස්ටර්ලන්තයේ ජිනීවා නුවර
    ආ) බැංකොක් ගිවිසුම, වෙළෙඳ ගිවිසුම

36. අ) සැලසුම්ගත ප්‍රතිඵල, නිවැරදි කිරීමේ ක්‍රියා මාර්ග
    ආ) වගකීම, වගවීම

37. අ) ගුණත්වය, තත්ව පාලනය/ගුණත්ව පාලනය
    ආ) ශුන්‍ය දෝෂ ශිල්පී ක්‍රමය,
    එකවරම ඒවා නිවැරදි කිරීමට

38. භාණ්ඩයේ ස්වභාවය　　　වෙළෙඳපොළ ස්වභාවය
    ඉල්ලුමේ ස්වභාවය　　　නිෂ්පාදකයාගේ ශක්තිය
    තරගකරුවන්ගේ බෙදාහැරීමේ මාර්ග　　　(මින් ඕනෑම 04 ක්)

39. අ) මූල්‍ය අතරමැදිකරණය
ආ) ශ්‍රී ලංකා මහ බැංකුව,බලපත්‍රලාභී වාණිජ බැංකු
බලපත්‍රලාභී විශේෂිත බැංකු

40. බඳවාගැනීමේ ප්‍රතිපත්තිය
පිරිවැය, කාලය, ශ්‍රම වෙළෙඳපොලේ තත්ත්වය **(ල.2x10=20)**

41. 1) සේවකයන් විසින් එම ආචාරධර්ම වලට අනුකූලව කටයුතු කිරීම.
2) ආයතනයේ කීර්ති නාමය ඉහළ නැංවීම
3) පෙර සිදු වූ යල්පැන ගිය විෂමාචාර වැලකී යාම.
4) විවිධ ව්‍යාපාර ශ්‍රිතයන් සඳහා ආචාරධර්ම සංග්‍රහ පිළියෙල කළ හැකිවීම.

42. 1) ජනතාවට සාධාරණ මිලකට අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා සැපයීම.
2) ඒකාධිකාරී ආයතන බිහිවීම වැලැක්වීම.
3) පෞද්ගලික අංශය විසින් අහිතකර ලෙස ලාභ ඉපැයීම වැනි වෙළෙඳපොළ තත්ත්ව පාලනය කිරීම.
4) ලාභ නොමැති පෞද්ගලික අංශය යොමු නොවන මහා පරිමාණ සංයෝජන ක්‍රම පවත්වාගෙන යාම.

43. 1) තම පවුලේ සාමාජිකයන්ගේ මතවාද
2) සමාජයේ පවත්නා මිත්‍යා විශ්වාස
3) පුද්ගල විශ්වාස හා ආකල්ප
4) අනුකරණය

44. 1) තම ආයතනයට ණය ලබා දීමේ හැකියාව
2) ණයගැතියාට ආපසු ගෙවීමේ හැකියාව
3) ණය දෙන ආයතනයේ ප්‍රතිපත්ති
4) ණය සඳහා ලබා දෙන සුරැකුම්
5) ණය මුදල යොදවන ව්‍යාපෘතියේ ශක්‍යතාව

45. 1) සියළු අවධානම් ඔප්පු
2) පූර්ණ අලාභය පමණක් ගෙවන ඔප්පුව
3) තොටුපල ඔප්පුව
4) අළුත්වැඩියා ඔප්පුව
5) තැනීම් හානි ඔප්පුව

46. 1) වැඩමුර ආරම්භය, අවසානය හා විවේකය
2) ඇසුරුම් හා බෙදාහැරීමේ කටයුතු
3) වාහන හා මගීන් හැසිරවීම

4) ගිලන්රථ, ආරක්ෂක රථ ආදිය ධාවනයට

5) කාසි හා නෝට්ටු මුද්‍රණයේ දී

47. 1) ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

2) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

3) නැව් සමාගම

4) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

48. 1) පුහුණු සේවකයන් සිටීම

2) අමුද්‍රව්‍යවල සුලභතාව

3) යන්ත්‍රසූත්‍ර නිසිපරිදි නඩත්තු කිරීම

4) විධිමත් සැලසුමක් සහිතවීම

49. 1) SLS සහතිකය

2) GMP සහතිකය

3) ISO 22000

4) HACCP

50. 1) ජාතික තත්ත්ව සම්මානය

2) ලියාපදිංචි වෙළෙඳ ලකුණ

3) ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

4) Youtube **(ල.2x10=20)**

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**දෙවන වාර පරීක්ෂණය - 2020**

**13 ශ්‍රේණිය**

**ව්‍යාපාර අධ්‍යයනය පිළිතුරු**

**II පත්‍රය**

01) ආ) i. ආහාර අවශ්‍යතාව **(ල.1/2)**

ii. බත්, පාන්, ඉඳි ආප්ප, ආප්ප **(ල.1/2)**

iii. ප්‍රවාහනය - භාණ්ඩ බෙදා හැරීම
සන්නිවේදනය - පුවත්පත් දැන්වීමක් පල කිරීම **(ල.01)**

ආ) අතීතයේ පැවති ව්‍යාපාර ලාභ ඉපයීම කෙරෙහි අවධානය යොමු කරමින් කටයුතු කළහ. මෙය කොටස්කරු සංකල්පය ලෙස ද අර්ථ දැක්විය හැකිය. මෙහි දී කොටස්කරුවන්ගේ අවශ්‍යතා මිස අනෙකුත් ඇල්මැති පාර්ශව වල අවශ්‍යතා කෙරෙහි අවධානය යොමු නොවීය. එහෙත් මෑත කාලයේ දී ව්‍යාපාර වල ඇල්මැති පාර්ශව කෙරෙහි අවධානය යොමු කිරීමේ ප්‍රවනතාවක් ඇත. ඒ අනුව සේවකයන්, ණයදෙනුකරුවන්, ප්‍රජාව, සැපයුම්කරුවන් කෙරෙහි අවධානය යොමු කරනු දැකිය හැකිය.

සේවක අවශ්‍යතා ඉටුකල විට ඔවුන් අභිප්‍රේරණය වේ. එවිට ඵලදායකත්වය ඉහළ යයි. ප්‍රජාව ගැන සැලකිලිමත් වූ විට ඔවුන්ගේ පක්ෂපාතීත්වය ලබා ගත හැකි වේ.
(ගැළපෙන පරිදී විස්තර සලකා බලා ලකුණු දෙන්න.) (ල.02)

ii. අ) අභ්‍යන්තර - විදුහල්පති, ගුරුවරු, ශිෂ්‍යයන් (පාර්ශව 02 කට) **(ල.01)**
බාහිර - වෙනත් පාසල්, ප්‍රජාව, ආදි ශිෂ්‍යයන්, රජය (පාර්ශව 02 කට) **(ල.01)**

ආ) එක් එක් පාර්ශවයගේ වැදගත්කම ශිෂ්‍යයා ලියා ඇති ආකාරය නිවැරදි නම් ලකුණු දෙන්න. **(ල.1/2x4=2)**

iii. අ) ආර්ථික තිරසාර සංවර්ධනය
පරිසර තිරසාර සංවර්ධනය
සමාජ තිරසාර සංවර්ධනය (කරුණු 03 ට, ල.01 මින් එක් කරුණක් තහවුරු කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග තුනට 01) (මෙයට අදාළ පිළිතුරු 12 ශ්‍රේණී ගුරු අත් පොත 48 හා 49 පිටුවල)

ආ)
1. මාධ්‍ය සදාචාරය ආරක්ෂා කරන වන පරිදි කටයුතු කිරීම
2. ඉදිරිපත් කරන වෙළෙඳ දැන්වීම් වල ගුණාත්මක බව ආරක්ෂා විය යුතුය
3. ලබාදෙන ප්‍රවෘත්ති සමාජයට අහිතකර හා හානිකර නොවිය යුතුය
4. භාෂාව භාවිතාය පිළිබඳ සැලකිලිමත් විය යුතුය
5. නිවේදන කටයුතු හා වැඩසටහන් තුළින් සමාජයට ගැලපෙන තොරතුරු පමණක් ලබා දීම
6. කාලීන වශයෙන් ගැලපෙන දෑ පමණක් සමාජයට ලබා දීම **(ල.1/2x4=2)**

iv. ව්‍යාපාරයක සේවකයන් විසින් අනුගමනය කළ යුතු, හෙවත් සේවක හැසිරීමට අදාළ වූ ආචාර ධර්ම ඇතුලත් ලියවිල්ල ආචාර ධර්ම සංග්‍රහය වේ. ආචාර ධර්ම සංග්‍රහය ලිඛිතව ප්‍රකාශ කිරීමෙන් සේවකයින් එය හොඳින් කියවා බලා තේරුම් ගනියි. එමෙන්ම එය ප්‍රායෝගිකව යොදා ගැනීමට උනන්දු වේ. මෙවැනි ආචාර ධර්ම සංග්‍රහයකින් පහත දැක්වෙන ප්‍රතිලාභ අත්කර ගත හැකිය.

1. ආයතනයේ කීර්ති නාමය ඉහළ යාම
2. විවිධ විශමාචාර වැලැක්විය හැකි වීම
3. ව්‍යාපාරයේ විවිධ අංශ වලට ගැලපෙන පරිදි ආචාර ධර්ම සංග්‍රහ පිළියෙල කළ හැකි වීම
4. ආයතනය තුළ පෙර පැවති විවිධ අහිතකර තත්ත්වයන් වැලකීයාම
5. සේවකයන් ආචාර ධර්මානුකූල වීම
6. ආයතනයේ ප්‍රතිරූපය වර්ධනය වීම **(ල.04)**

v. 1. ඉවතලන ද්‍රව්‍ය අඩු කිරීම
2. නැවත නැවත පරිහරණයට ගැනීම
3. ප්‍රතිචක්‍රීකරණය
4. ප්‍රතිස්ථාපනය
පැහැදිලි කිරීම කළ යුතුය ( 12 ශ්‍රේණිය ගුරු අත් පොත 50, 51 පිටු) **(ල.1x4=4)**

02. i. අ) 1. බදු ගෙවීම
2. දේශීය සම්පත් භාවිතය
3. රජය ක්‍රියාත්මක කරන ප්‍රතිපත්ති පිළිපැදීම
4. නීතිරීති පිළිපැදීම
5. සේවා නියුක්තියට දායක වීම
6. පරිසරයට වන හානිය අවම වීම **(ල.1/2x4=2)**

ආ) 1. ආනයනික භාණ්ඩ සඳහා රේගු බදු අයකිරීමෙන් ආනයන සීමා වන අතරම දේශීය නිෂ්පාදනය වර්ධනය කරගත හැකිවීම/ දේශීය කර්මාන්ත ආරක්ෂා කරගත හැකිවීම.
2. දේශීය නිෂ්පාදිත මත බදුඅයකිරීමෙන් භාණ්ඩ හා සේවා වල මිල ඉහළ යාම.
3. රජය, යටිතල පහසුකම් මත වියදම් දැරීම නිසා ව්‍යාපාරික කටයුතු පහසු වීම. **(ල.1x2=02)**

ii. අ) දැනුවත්භාවයකින් යුත් පාරිභෝගිකයා ගෙවන මුදලට සරිලන වටිනාකමකින් යුත් ප්‍රමිතියෙන් ඉහළ භාණ්ඩ තෝරා ගැනීමට පෙළඹී ඇත. එමෙන්ම වෙළෙඳ විෂමාචාර හා පාරිභෝගික අයිතිවාසිකම් කඩවීම් පිළිබඳ ව අදාළ බලධාරී දැනුවත් කර අදාළ ක්‍රියාමාර්ග ගැනීමට පෙළඹී ඇත. තව ද තමා ජීවත් වන පරිසරය ආරක්ෂා කර ගනිමින් , සමාජය පිළිබඳ සැලකිලිමත් වෙමින් සහයෝගයෙන් කටයුතු කරමින් තාර්කික පාරිභෝගිකයෙකු ලෙස වෙළෙඳපොළ තුළ කටයුතු කරයි. **(ල.02)**

ආ)
1. ප්‍රමිති පිළියෙල කිරීම
2. ප්‍රමිති ක්‍රියාත්මක කිරීම
3. ISO ප්‍රමිති ක්‍රියාත්මක කිරීම
4. ප්‍රමිතිකරණය හා තත්ත්ව පාලනය පිළිබඳ පුහුණු පාඨමාලා සංවිධානය කිරීම
5. ප්‍රමිතිකරණය සහ තත්ත්ව පාලන ප්‍රවර්ධන කටයුතු
6. උපකරණ ක්‍රමාංකන සේවා
7. පාරිභෝගික අධ්‍යාපනය ප්‍රචලිත කිරීම
8. පුස්තකාල සේවාව, දේශීය විදේශීය ප්‍රමිත අලෙවිය සහ තොරතුරු සේවා
9. තත්ත්ව පද්ධති පිළිබඳ අන්තර්ජාතික ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම **(ල.1/2x4=2)**

iii. අ) 1. වැඩි පිරිසක් හරහා විශාල ප්‍රාග්ධනයක් රැස්කර ගත හැකි වීම.
2. ව්‍යාපාරයට නීතිමය පුද්ගලභාවයක් තිබීම.
3. ව්‍යාපාරයට අඛණ්ඩ පැවැත්මක් තිබීම.
4. අයිතිකරුගේ වගකීම සීමිත වීම. **(ල.1/2x4=2)**

ආ) මෙය සී/ස පුද්ගලික සමාගමක් ලෙස ආරම්භ කිරීමට තීරණය කර ඇති නිසා එයට කසුන් සමාගම යන නම යෙදිය නොහැකිය. සී/ස කසුන් (පුද්.) සමාගම ලෙස නම් කළ යුතුය. **(ල.02)**

iv. අ) 1. ප්‍රාග්ධන සම්පාදනය අඩු විම.
2. සාමාජික ප්‍රමාණය අඩු වීම.
3. කළමනාකරණ දුර්වලතා
4. නිලධාරී පාලනයට යටත් වීම.
5. සුදුසුකම් නොමැති පුද්ගලයන් කළමනාකරණයට පත්වීම.
6. ස්වාධීනත්වය පිරිහීම හා දේශපාලණීකරණය වීම. **(ල.1/2x4=2)**

ආ) 1. සමුපකාර සමිතියක් ආරම්භ කිරීම පහසු විම.
2. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් පැවතිම.
3. අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා සාධාරණ මිලට සැපයීම.
4. විවිධ ක්ෂේත්‍රවල ව්‍යාපාරික කටයුතු කළ හැකි වීම.
5. අන්‍යොන්‍ය සහයෝගයෙන් කටයුතු කිරීම.
6. සමිතිය උපයන අතිරික්තය සාමාජිකයින් සතු කිරීම හෙවත් අනුග්‍රාහක ප්‍රතිගෙවීම. **(ල.1/2x4=2)**

v. ආ) i) කොටස් නිකුත් කිරීමක් සිදු නොකරන, සාමාජිකයන්ගේ වගකීම සාංගමික ව්‍යවස්ථාවලියේ සඳහන් කර ඇති ඇප වටිනාකමට සීමාවන සමාගම් වේ. **(ල.01)**

ii) 1. කොටස් නිකුත් කිරීමක් සිදු නොකිරීම.
2. සාංගමික ව්‍යවස්ථාවලියේ එක් එක් සාමාජිකයා විසින් සමාගම ඈවර කිරීමේ දී දායක වියයුතු ප්‍රමාණය සඳහන් කළ යුතු වීම.
3. අවම වශයෙන් සාමාජිකයන් දෙදෙනෙකුවත් සිටිය යුතුවීම හා උපරිමය පිළිබඳ සීමාවක්නොවීම.
4. පොදු පරමාර්ථ පෙරදැරි කරගෙන ආරම්භ කිරීම.
5. සමාගමේ ලාභ බෙදාහැරීමක් නොතිබීම. **(ල.1/2x2=1)**

ආ) i) සමාගම් දෙකක් හෝ කිහිපයක් එකට එකතු වී කටයුතු කිරීම ව්‍යාපාර සංයෝජනය ලෙස හැඳින්විය හැකිය. **(ල.01)**

ii) ඒකාබද්ධ වීම
අත්පත් කර ගැනිම **(ල.1/2x2=1)**

03. i. අ) දසුනි **(ල.01)**

ආ) 1. දසුනි නව අදහසක් අනුව ව්‍යාපාරය අරඹා තිබීම
2. ඇය ව්‍යාපාර අවදානම්වල මුහුණ දෙන්නියක් වීම
3. සාම්ප්‍රදායික ව්‍යාපාර කටයුතුවලින් බැහැර විම **(ල.1/2x2=1)**

ඇ) ව්‍යාපාරිකයෙකු ලෙස **(ල.01)**

ඈ)

| ව්‍යවසායකයා | ව්‍යාපාරිකයා |
|---|---|
| • තම අදහස් හෝ නව සංකල්ප අනුව ව්‍යාපාර කරයි.<br>• ව්‍යාපාරික ප්‍රතිවාදියා තමාය.<br>• නව ව්‍යාපාර අවස්ථා සඳහා සූදානම් වෙයි.<br>• අවධානම් වලට මුහුණ දෙයි. | • පවතින අදහසක් හෝ සංකල්පයක් අනුව ව්‍යාපාරයක් අරඹයි.<br>• ප්‍රතිවාදියා වෙනත් කෙනෙකි.<br>• පවතින ව්‍යාපාරයේ නිරත වෙයි.<br>• ආරක්ෂාකාරීව කටයුතු කරයි.<br>**(ල.1/2x2=1)** |

ii. අ) 1. කුඩා වෙළෙඳපොළ කොටසක් හිමි විම. 2. සුළු ප්‍රාග්ධනයක් ආයෝජනය කර තිබීම.
3. මූල්‍යමය බැඳීම අවම වීම. 4. සේවක සංඛ්‍යාව අවම වීම.
5. ස්වාධීන කළමනාකරණය. **(ල.1/2x4=2)**

ආ) ගුරු අත්පොත 128, 129 පිටු හෝ 2019 මහ බැංකු වාර්ථාව ඇසුරින් **(ල.02)**

iii. අ) 1. චෙක්පත් මගින් ගෙවීම් කළ හැකි විම
2. ප්‍රේෂණ පහසුකම් ලබා ගත හැකි වීම
3. නිත්‍ය නියෝග මත ගෙවීම් කළ හැකි වීම
4. අයිරා පහසුකම් ලබා ගත හැකි විම
5. බැංකුව සමඟ කළ ගණුදෙනු වල වාර්තා ලබා ගත හැකි විම
මෙම ප්‍රයෝජන ජංගම ගිණුමකින් ලබා ගත හැකි වන නිසා ව්‍යාපාර කටයුතු කරගෙන යාමට ජංගම ගිණුමක් ආරම්භ කිරීම වැදගත් වන බව පැහැදිළි කරන පරිදි පිළිතුරු ලිවිය යුතුය. **(ල.02)**

ආ) ගුරු අත්පොත 12 ශ්‍රේණිය 156 පිටුව **(ල.02)**

iv. i. ලංකා සෙට්ල් - තත්කාලීන දළ පියවුම් පද්ධතිය හා නිර්ලේඛන සුරකුම්පත් පද්ධතිය එකට ගත්කල ලංකා සෙට්ල් පද්ධතිය ලෙස හැඳින්වේ. මේ මගින් ව්‍යාපාර වල ආයෝජන සුරක්ෂිතතාව ඇති වීම. මූල්‍ය ගනුදෙණු පහසු වීම හා කාර්යක්ෂම වීම සිදු වේ. **(ල.01)**

ii. ස්විෆ්ට් - නවීනතම තාක්ෂණය මත පදනම් වූ ලොව පුරා මූල්‍ය වෙළෙඳපොළවල් ආවරණය කෙරෙන සන්නිවේදන ජාලයකි. මේ මගින් ජාත්‍යන්තර වශයෙන් බැංකු අතර සිදුවන මුදල් පැවරුම් පිළිබඳ කටයුතු කරයි. **(ල.01)**

iii. ලංකා සෙක්‍යුර් - මුද්‍රණය කරන ලද සුරකුම්පත් භාවිතය වෙනුවට සුරකුම්පත් මිල දී ගැනීමට හෝ විකිණීමට අදාළ ගණුදෙනුවක් කිරීම සඳහා ලේඛන රහිතව භාවිතා වන ක්‍රම ලංකා සෙක්‍යුර් යන නමින් හැඳින්වේ. **(ල.01)**

iv. ස්ලිප්ස් - පරිගණක භාවිතා කරමින් බැංකු අතර සිදුවන ගණුදෙනු පියවීම සඳහා භාවිතා කරනු ලබන ක්‍රමයකි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගෙන යනු ලැබූ මෙම අන්තර් බැංකු ගෙවීම් පද්ධතියශ්‍රී ලංකා මහ බැංකුවට,හා වාණිජ බැංකුවලට හවුල් අයිතියක් ඇති සීමා සහිත ලංකා ස්ලිප්ස් (පොදු) සමාගම වෙත පවරා ඇත. **(ල.01)**

v. 1. දිනය
2. බැංකුවේ නම හා ශාඛාවේ නම
3. ආදායකයාගේ නම
4. හෝ රැගෙන එන්නාට යන යෙදුම
5. චෙක්පතේ වටිනාකම අකුරෙන් හා ඉලක්කමෙන්
6. ගෙවනු යන පදය
7. අණකරුගේ අත්සන
8. චුම්භක අක්ෂර හැදුනුම් තීරය
9. චෙක් පිළිපත **(ල.04)**

04. i. අ) 1. නෛතික බැඳීමක් ඇති කර ගැනීමේ අදහස
2. අර්පනය හෙවත් යෝජනාව
3. ප්‍රතිග්‍රහනය හෙවත් පිළිගැනීම
4. නෛතික බව - නීතියට එකග බව
5. ඒ ඒ පාර්ශවයන්ට නෛතික බැඳීමක් ඇතිකර ගැනීමට ඇති හැකියාව **(ල.02)**

ආ) රක්ෂණය මගින් සිදුවන්නේ කවර හෝ පාර්ශවයකට හෝ දේපළකට සිදුවිය හැකි හානි සඳහා වන්දි ආවරණ ලබා දීමයි. රක්ෂණය මගින් කිසියම් රක්ෂිත විෂය වස්තුවකට වන හානි වැලැක්විය නොහැකි වේ. හානියක් වූ විට එය නැවත යථාතත්වයට පත් කිරීමට හෝ හානිය වෙනුවෙන් වන්දි මුදලක් පමණක් ලබා දීම සිදු කෙරෙයි. **(ල.02)**

ii. අ) 1. බෙදාහැරීම කඩිනම් විම
2. කාලය ඉතිරිවීම
3. විදේශීය ආයෝජකයන් ආකර්ෂණය වීම
4. මාර්ග තදබදය අවම වීම
5. ප්‍රදේශීය සංවර්ධනයක් ඇති වීම
6. රැකියා අවස්ථා බිහිවීම **(ල.1/2x4=2)**

ආ) 1. ගුවන් මාර්ග හා ගුවන් පාලම් ඉදිකිරීම
2. ප්‍රධාන නගර වලට ඇතුල්වීම පිටවීම සඳහා මාර්ග වෙන් කිරීම
3. මාර්ග නීති නිසි පරිදි ක්‍රියාත්මක කිරීම
4. විකල්ප මාර්ග හඳුන්වාදීම හා පුළුල් කිරීම
5. නගරයට පැමිණෙන පෞද්ගලික වාහන සීමා කිරීම **(ල.1/2x4=2)**

(යෝජනා සැලකිල්ලට ගෙන ලකුණු ලබා දෙන්න)

iii. අ) 1. ගොඩනැගිල්ලේ පිරියත සැලැස්ම හා ඉඩකඩ
2. ද්‍රව්‍ය භාවිතයෙන් වේගවත් බව හා ගබඩාව තුළ කලාප වෙන් කිරීමේ අවශ්‍යතාව
3. ප්‍රධාන සම්බන්ධතාවලට ආසන්න බව
4. ද්‍රව්‍ය එහා මෙහා කිරීමේ හැකියාව
5. ගබඩාකරණ ද්‍රව්‍යයේ ස්වභාවය 6. පිරිවැය **(ල.1/2x4=2)**

ආ) 1. ආරක්ෂාකාරී භාරදීමේ සේවාවක් වීම
2. වඩා වේගවත් හා කාර්යක්ෂම සේවාවක් තිබීම
3. ජාත්‍යන්තර වශයෙන් පුළුල් ව ව්‍යාප්ත වීම
4. සේවා රැසක් ඉටු කිරීම **(ල.1/2x4=2)**

iv. අ) 1. විද්‍යුත් මුදල් භාවිතය
2. ස්වයං සේවා ක්‍රමය
3. නවීන තාක්ෂණය භාවිතය
4. වාහන නැවැත්වීමේ පහසුකම්
5. විවිධ භාණ්ඩ වර්ග එක ස්ථානයක දීලබා ගැනීමට සැලැස්වීම **(ල.1/2x4=2)**

ආ) භාණ්ඩ මිලදී ගැනීමට පාරිභෝගිකයා වෙළෙඳසැල වෙත නොගොස් දුරකථන, ෆැක්ස්, අන්තර්ජාලය, කැටලොග් භාවිතයෙන් භාණ්ඩ ඇනවුම් කර ලබා ගැනීමයි. **(ල.01)**
1. අන්තර්ජාල වෙබ් අඩවි හරහා සිදුවන විද්‍යුත් වෙළෙඳාම (Online Retailing)
2. ඍජු අලෙවිකරණය (Direct Marketing) **(ල.01)**

v. අ) 1. බදු සහන ලබා ගැනීම
2. තීරු ගාස්තු සම්බන්ධ ගිවිසුම් වලට එළඹීම **(ල.1x2=2)**

ආ) 1. අපනයනකරුවෙකු ලෙස ලියාපදිංචි වීම
2. විදේශ ගැනුම්කරුවෝ සොයා ගැනීම
3. අපනයන බලපත්‍රය ලබා ගැනීම (අවශ්‍ය නම්)
4. ආනයනකරුගෙන් ලැබුණු මිල විමසුමට ප්‍රතිචාරයක් වශයෙන් මිල කියුමක් යැවීම
5. ආනයනකරුගෙන් ඉන්ඩෙන්ටුව ලබා ගැනීම
6. භාණ්ඩ තොගය නැව්ගත කිරීම සඳහා අවශ්‍ය ඉඩ වෙන්කර ගැනීම හා අවශ්‍ය ලියවිලි සකස් කර ගැනීම
7. නැව්ගත කිරීමට සුදුසු ආකාරයට භාණ්ඩ ඇසුරුම් කිරීම
8. අපනයන භාණ්ඩ තොගය රක්ෂණය කිරීම
9. භාණ්ඩ නැව්ගත කර නෞභාරපත ලබා ගැනීම
10. මුදල් ලබා ගැනීමට කටයුතු කිරීම **(ල.02)**

05. i. අ) කිසියම් නිශ්චිත ගැටළුවක් විසඳීම සඳහා ගත යුතු විකල්ප විසඳුම් ක්‍රියාමාර්ග හඳුනා ගැනීමත් ඒ අතරින් සුදුසු විකල්පය තෝරා ගැනීම් ඇතුලත් ක්‍රියාවලිය **(ල.02)**

ආ) 1. ගැටළුව හඳුනා ගැනිම
2. ගැටළුව විශ්ලේෂණය කිරීම
3. විකල්ප විසඳුම් ගොඩ නැගීම
4. විකල්ප විසඳුම් ඇගයීම
5. හොඳම විකල්පය තේරීම
6. හොඳම විකල්පය ක්‍රියාත්මක කිරීමට සැලසුමක් සෑදීම
7. සැලැස්ම ක්‍රියාත්මක කිරීම
8. ඇගයීම හා ප්‍රතිපෝෂණය **(ල.1/4x8=2)**

ii. අ) ආයතනයක ඉලක්ක හා පරමාර්ථ ස්ථාපිත කිරීමත් ඒවා සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය කටයුතු පිළියෙල කිරීමත් සැලසුම්කරණයෙන් සිදුවන නිසා එය අනාගතය සඳහා වූ ක්‍රියාවලියක් ලෙස දැක්විය හැකිය. **(ල.02)**

ආ) දැක්ම උපායමාර්ග
මෙහෙවර ක්‍රියාමාර්ග
පරමාර්ථ නීතිරීති
ඉලක්ක වැඩසටහන්
ප්‍රතිපත්ති ව්‍යාපෘති **(ල.1/2x4=2)**

iii. එකඟ නොවේ. **(ල.01)**

අග්‍ර කළමනාකරුවන්ට වැඩි වශයෙන් අවශ්‍ය වන්නේ සංකල්පනාත්මක කුසලතාය. එනම් සංවිධානයේ අභ්‍යන්තර හා බාහිර පරිසරය පිළිබඳ අවබෝධය, සමස්ථය දැකීමේ හැකියාව, ගැටළු විසඳීමේ හැකියාව ආදී කුසලතා මීට අයත් වේ.

නමුත් එම කළමනාකරුවන්ට අවශ්‍ය වන්නේ සංකල්පනාත්මක කුසලතා පමණක් නොවේ. අන් අය සමඟ සහයෝගයෙන් වැඩ කිරීමට හා මානුෂිකව අන් අය ලවා වැඩ කරවා ගැනීමට මානව කුසලතාහෙවත් අන්තර් පුද්ගල කුසලතා ද කාර්යන් සම්බන්ධ සුවිශේෂී දැනුම හා පලපුරුද්ද හා හැකියාව සඳහා තාක්ෂණික කුසලතාවය ද අග්‍ර කළමනාකරුවන්ට පැවතිය යුතුය.
**(ල.03)**

iv. කාර්ය හදුනාගැනීම, වැඩ බෙදීම, දෙපාර්තුමේන්තුකරණය, වගකීම් හා බලතල පැවරීම, වැඩකිරීමේ ප්‍රමිති ඇති කිරීම, සම්පත් බෙදා දීම, සමායෝජනය ආදී පියවර සැලකිල්ලට ගෙන අදාල පරිදි ලකුණු ලබා දෙන්න.
**(ල.04)**

v. අ) සංවිධාන ව්‍යුහය ඇඳ ඇති ආකාරය අනුව නිවැරදි ලකුණු ලබා දෙන්න. **(ල.02)**

ආ) විදුහල්පතිතුමා වැඩි බලතල ප්‍රමාණයක් හිමි පාර්ශවයක් බැවින් වැඩ බෙදා දීමේ රටාව අනුගමනය කොට ඉන් කොටසක් පහළ මට්ටමේ සිටින නියෝජ්‍ය හා සහකාර විදුහල්පතිවරුන්ටත්, අංශ ප්‍රධානීන්, පන්තිභාර, විෂයභාර ගුරුවරුන්ටත්, ශිෂ්‍ය නායක නායික සහ පන්ති නායක නායිකා වශයෙන් වගකීම් හා බලතල විමධ්‍යගතකරණය කරණු ලබයි.

මධ්‍යගතකරණයේ දී ආයතනයේ සියලු බලතල විදුහල්පතිතුමා මත රඳවා ගෙන තීරණ ගැනීම මධ්‍යගතකරණය ලෙස හැදින්වේ. **(ල.02)**

06. i. <u>ද්‍රව්‍ය මිලදී ගැනීම</u> **(ල.1/2)**

ව්‍යාපාරයේ නිෂ්පාදන කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම. **(ල.1/2)**

උදා - අමුද්‍රව්‍ය, ප්‍රාග්ධන උපකරණ
යන්ත්‍ර උපකරණ
ඉන්ධන **(ල.1/2 උදාහරණ)**

ව්‍යාපාරයේ පරිහරණය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම **(ල.1/2)**

උදා - ලිපි ද්‍රව්‍ය, කාර්යාල උපකරණ **(ල.1/2 උදාහරණ)**

<u>සේවා මිලදී ගැනීම</u> **(ල.1/2)**

උදා - ආරක්ෂණ සේවා
නඩත්තු සේවා
ප්‍රවාහන සේවා
ජලය, විදුලිය **(ල.01)**

ii. අ)
1. නිෂ්පාදන ක්‍රියාවලිය අඛන්ඩව පවත්වාගෙන යාමට
2. සැපයුම් සම්බන්ධතා අඛන්ඩව පවතිවාගෙන යාමට
3. ඌන හෝ අතිරික්ත තොග නිසා ඇති වන පිරිවැය නාස්තිය අවම කර ගැනීමට
4. යන්ත්‍ර හා ශ්‍රම ඵලදායීතාවය ඉහළ මට්ටමක පවත්වා ගෙන යාම
5. අනපේක්ෂිත ඉල්ලුම් තත්ත්වයන්ට සාර්ථකව මුහුණ දීම **(ල.1/2x4=2)**


ආ) <u>වාසි</u>

- තොග පාලනය කාර්යක්ෂම වීම
- තොග යාවත්කාලීනව පවත්වා ගත හැකි වීම
- තොග වාර්තා ලබා ගැනීම පහසුවීම
- තොග සම්බන්ධ තොරතුරු ආරක්ෂා කර ගත හැකි වීම **(ල.1/2x2=1)**

අවාසි

- තාක්‍ෂණික දැනුම හා පුහුණුව නිරන්තරයෙන් යාවත්කාලීන කල යුතු වීම
- පද්ධති ස්ථාපිත කිරීමට විශාල පිරිවැයක් දැරිය යුතු වීම
- පද්ධති අක්‍රිය වීම සමස්ථ ක්‍රියාවලියටම බලපෑමක් සිදු කල හැකි විම **(ල.1/2x2=1)**

iii. අ)




**(නිවැරදි ක්‍රියාවලියට ල.02)**

ආ) ක්‍රියාවලි පිරියත
නිෂ්පාදිත පිරියත
ස්ථාවර ස්ථානීය පිරියත
කුටි පිරියත **(ල.1/2x4=2)**

iv.

i) දැව 80 000
තීන්ත 40 000
වැටුප් 15 000
රු. 135 000 **(ල.01)**

ii) විචල්‍ය පිරිවැය + ස්ථාවර පිරිවැය
135 000 + 45 000
= රු 180 000 **(ල.01)**

iii) $\frac{180\ 000}{500}$ $\frac{\text{මුළු නිෂ්. පිරිවැය}}{\text{නිෂ්. ඒකක}}$ **(ල.01)**
= රු. 360

iv) මුළු ආදායම 325 000 (650 x 500)
මුළු පිරිවැය (180 000)
රු. 145 000 **(ල.01)**

v. <u>ප්‍රතිලාභ</u>

- නාස්තිය අවම වීම
- නව නිෂ්පාදිත හඳුන්වා දීම
- නිෂ්පාද්ත වල ගුණත්වය ඉහළ යාම
- කාර්යක්ෂමතාවය ඉහළ යාම
- හිතකර වැඩ පරිසරයක් නිර්මාණය වීම
- නිෂ්පාදන ධාරිතාව වැඩි වීම
- මහා පරිමාන පිරිමැසුම් ලබා ගත හැකි වීම

**(ල.1/2x4=2)**

<u>ගැටලු</u>

- තාක්‍ෂණය සීග්‍රයෙන් වෙනස් වීම
- විශාල ආයෝජනයක් අවශ්‍ය වීම
- පාරිසරික ගැටලු මතු වීම
- තාක්‍ෂණික බිඳ වැටීම් නිසා ඇතිවන දෝශ
- ශ්‍රමිකයන් පුහුණු කළ යුතු වීම

**(ල.1/2x4=2)**

07. i.

අ) ප්‍රචාරණයේ දී සිදු වන්නේ කිසියම් පිරිවැයක් දරා වෙහෙස මහන්සි වී ව්‍යාපාරයේ අලෙවිය වැඩිකර ගැනීමේ අරමුණින් කරනු ලබන ක්‍රියාවලියකි. ආයතනයක් කිසියම් පිරිවැයක් නොදරා ව්‍යාපාරයේ බලපෑමකින් තොරව පාරිභෝගිකයා තුල ව්‍යාපාරය තුල ඇතිවන යහපත් ප්‍රතිරූපය නිසා ඇතිවන තත්ත්වයකි. ප්‍රසිද්ධිය මෙ අනුව ප්‍රචාරණය තුළින් සිදුවන්නේ භාණ්ඩය පාරිභෝගිකයා වෙත ගෙනයාමක් වන අතර ප්‍රසිද්ධියේ දී පාරිභෝගිකයා භාණ්ඩය සොයා පැමිණේ.
(මේ කරුණු පැහැදිළි වන පිළිතුරට) **(ල.02)**

ආ) 1. දැනුම් දීම
2. පෙළඹ වීම
3. සිහි කැදවීම
එක් වාක්‍යයක් බැගින් පැහැදළි කිරීම ප්‍රමාණවත්ය.

- <u>දැනුම් දීම</u>
  භාණ්ඩය පිළිබඳ පාරිභෝගිකයා දැනුවත් කිරීම මේ මඟින් සිදු වේ. නව භාණ්ඩ පිළිබඳව, භාණ්ඩයේ ප්‍රතිලාභ පිළිබඳව, මිල වෙනස් කිරීම් පිළිබඳව, වැරදි ආකල්ප නිවැරදි කිරීම ආයතනය පිළිබඳ ව ලබා ගත හැකි සේවා පිළිබඳව දැනුම් දීම.
- <u>පෙළඹ වීම</u>
  භාණ්ඩය මිලදී ගැනීම සඳහා දිරිමත් කිරීම, ගණුදෙනුකරුගේ මිලදී ගැනීමේ අදහස් වෙනස් කිරීම
- <u>සිහිපත් කිරීම</u>
  නැවත නැවත මතක් කිරීම මඟින් මතකයේ රදවා ගැනීම, මිලදී ගත හැකි ස්ථාන, භාණ්ඩය හා සේවාවේ අවශ්‍යතාව සිහිපත් කිරීම.

**(ල.02)**

ii. 1. හර ප්‍රතිලාභය
2. මූලික නිෂ්පාදිතය
3. අපේක්ෂිත නිෂ්පාදිතය
4. වැඩිදියුණු කල නිෂ්පාදිතය
5. විභව නිෂ්පාදිතය **(ල.04)**

iii. අ) ඉසව්, අත්දැකීම්, පුද්ගලයින්, ස්ථාන, සංවිධාන, දේපල, තොරතුරු, අදහස් **(ල.01)**
භාණ්ඩ හා සේවා හැර අනෙකුත් කරුණු 04 ක් විස්තර කර ඇත්නම් **(ල.01)**
(13 ශ්‍රේණිය ගුරු අත්පොත 121, 122 පිටු)

ආ) 1. නිෂ්පාදිතයේ ස්වභාවය
2. ඇසුරුමෙන් නිෂ්පාදිතයාට ලැබෙන ප්‍රයෝජන
3. තාක්ෂණික යෝග්‍යතාව
4. ඇසුරුමේ අංග
5. වෙළෙන්දාට ඇති පහසුව
6. පාරිභෝගිකයාට ඇති පහසුව
7. පරිසර හිතකාමී බව **(ල.02)**

iv. අ) 1. නව නිෂ්පාදිත ගැනුම්කරුවන් වෙත හඳුන්වා දීමට
2. පවතින නිෂ්පාදිත වල අලෙවිය ඉහළ දැමීමට
3. ඉලක්ක ගණුදෙනුකරුවන්ට නිෂ්පාදිත පිළිබඳ විවිධ තොරතුරු සන්නිවේදනය කිරීමට
4. අනෙකුත් තරඟකාරී වෙළෙඳ නිෂ්පාදිත පිළිබඳ විවිධ තොරතුරු සන්නිවේදනය කිරීමට
5. ආයතනයේ ප්‍රතිරූපය ඉහළ නංවාලීමට
6. අනාගත ඉල්ලුම වර්ධනය කිරීමට **(ල.02)**

ආ) 1. වෙළෙඳපොළ තුල රැඳී සිටීමට
2. වර්තමාන ලාභ උපරිම කිරීම
3. වෙළෙඳපොළ කොටස උපරිම කිරීම
4. වෙළෙඳපොළ සාරය උරා ගැනීම
5. නිෂ්පාදිත ගුණත්ව නායකත්වය **(ල.02)**

v. අ) මිනිසුන්
ක්‍රියාවලිය
භෞතික වටපිටාව (නම් කිරීමට) **(ල.1/2)**
විස්තර කිරීම් ගුරුඅත් පොත 13 ශ්‍රේණිය 116 පිටුව **(ල.1/2x3=1 1/2)**

ආ) භූගෝලීය පදනම - රටවල්, කලාප, ප්‍රදේශ
දේශගුණ සාධක
නගරවල විශාලත්වය

ප්‍රජා විද්‍යාත්මක සාධක පදනම - වයස
ආදායම

මනෝ විද්‍යාත්මක පදනම - සමාජ පන්ති
ජීවන රටාව

චර්යාත්මක සාධක - ප්‍රතිලාභ
මිලට ගන්නා අවස්ථා

(තවත් උදාහරණ ගුරුඅත් පොත 111 පිටුවේ ඇත.) **(ල.1/2x4=2)**

08. i. අ) ලැබීම් මාර්ග
- අත්පිට විකුණුම්
- ජංගම නොවන වත්කම් විකිණීම

ගෙවීම් මාර්ග
- තොග මිලට ගැනීම
- වැටුප් හා වේතන ගෙවීම
- ජංගම නොවන වත්කම් මිලදී ගැනීම **(ල.02)**

ආ) 1. ව්‍යාපාර හිමිකරුවන්ගේ ව්‍යාපාරය හා සබැඳි අගය උපරිම කිරීම
2. ලාභ උපරිම කිරීම
3. කොටසක ඉපයුම උපරිම කිරීම
4. දිගුකාලීන මූල්‍ය ස්ථාවරත්වය තහවුරු කිරීම
5. ද්‍රවශීලතාව ප්‍රශස්ථ මට්ටමක පවත්වා ගැනීම **(ල.1/2x4=2)**

ii. i) $\frac{\text{ද්‍රවශීල වත්කම්}}{\text{ජංගම වත්කම්}}$

ii) $\frac{\text{බදු පෙර ශුද්ධ ලාභය}}{\text{විකුණුම්}}$

iii) $\frac{\text{විකුණු භාණ්ඩවල පිරිවැය}}{\text{සාමාන්‍ය තොගය}}$

iv) $\frac{\text{පොළී හා බදු වලට පෙර ලාභය}}{\text{පොලීය}}$ **(ල.1x4)**

iii. ආ) 1. ස්ථාවර ප්‍රතිලාභ ලැබීම
2. රජයේ ඉහළ ආරක්ෂාව ලැබීම
3. ඉහළ ද්‍රවශීලතාවය
4. බදු සහන
5. අවදානම් අඩු වීම
6. කල්පිරීමට පෙර වට්ටම් කර ගත හැකි වීම **(ල.1/2x4=2)**

ආ) රජයට අවශ්‍ය මැදි හා දිගුකාලීන ණය ලබා ගැනීම සඳහා රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කරන නිර්ලේඛන සුරකුම්පත් වර්ගයකි. **(ල.01)**

- මැදි හා දිගුකාලීන ණය උපකරණයක් වීම
- අර්ධ වාර්ෂික කූපන් ක්‍රමයට පොළී ගෙවීම **(ල.01)**

iv. ආ) 1. භාණ්ඩය හෝ සේවාව සඳහා වූ ඉල්ලුම
2. ආයතනයේ පරමාර්ථ
3. නිෂ්පාදන ක්‍රමය
4. අනාගත සේවක විශ්‍රාම යාම්, ඉල්ලා අස්වීම්, උසස් වීම්, ඉවත් කිරීම්, සේවා නියුක්තිය අවසන් කිරීම
5. ආයතනයේ වර්තමාන හා අනාගත මූල්‍ය තත්ත්වය
6. ආර්ථික, සමාජීය, දේශපාලන හා නෛතික පරිසරය **(ල.1/2x4)**

ආ) වාසි

- නව දැනුම ඇති පුද්ගලයන් ආකර්ෂණය කරගත හැකි වීම
- විශාල පිරිසක් ආකර්ෂණය කරගත හැකි වීම
- තනතුරු සඳහා යෝග්‍යතම පුද්ගලයන් බඳවා ගත හැකි වීම
- පුහුණු ශ්‍රමය බඳවා ගැනිමෙන් පුහුණුව හා සංවර්ධනය සඳහා වැයවන පිරිවැය අඩු වීම
- ව්‍යාපාර සංවිධානය නවීකරණය වීම **(ල.1/2x2=1)**

අවාසි

- ආයතනයේ සිටින සේවකයන්ගේ අභිප්‍රේරණයට බාධා ඇති වීම
- ආකර්ෂණය සඳහා වැයවන පිරිවැයඉහළ යාම
- ආකර්ෂණය සඳහා ගතවන කාලය අධික වීම
- සේව්‍ය - සේවක සබඳතාවලට අහිතකර ලෙස බලපෑ හැක **(ල.1/2x2=1)**

v.

<u>රැකියා විස්තරය</u>

තනතුරු නාමය :

රැකියා අංකය :

ශ්‍රේණිය :

රැකියාව පිහිටි අංශය :

දෙපාර්තමේන්තුව :

ආසන්නතම ප්‍රධානියා :

යටතේ සේවක තනතුරු :

රැකියාවේ කටයුතු රාජකාරී හා වගකීම්

1.

2.

3.

4.

සේවා කොන්දේසි

පිළියෙල කළේ ................................... දිනය
(රැකියා විශ්.)

පරීක්ෂා කළේ ................................... දිනය
(අංශ ප්‍රධාන)

අනුමත කළේ ................................... දිනය
(දෙපා. ප්‍රධාන)

**(ල.04)**



LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
G.C.E. O/L
විද්‍යාව
A9+
ඉංග්‍රීසි භාෂාව
ENGLISH LANGUAGE
සිංහල
G.C.E. O/L SINHALA
General English
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON
DELIVERY
HOME
DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440